# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1776/36 - 2012 සැප්තැම්බර් මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2012.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 51/53 (III)

**(437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත**

(437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද සමරසිංහ,
වැවිලි කර්මාන්ත අමාත්‍ය.

2012 ක් වූ අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මේ නියෝග 2012 අංක 917/1 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. යම් වත්තක හෝ කුඩා ඉඩමක අයිතිකරුවකු වන යම් තැනැත්තෙකු විසින් කරනු ලබන තත් කාර්යය සඳහා වූ ලිඛිත ඉල්ලීමක් මත, රබර් පාලකවරයා විසින් ඒ වත්තේ හෝ කුඩා ඉඩමේ නැවත වගා කිරීමේ කාර්යය සඳහා (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) (437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලින් ඒ තැනැත්තාට සහනාධාරයක් මෙම නියෝගවල විධිවිධානවලට අනුකූලව ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

03. 2 වැනි නියෝගය යටතේ සහනාධාරයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, රබර් පාලකවරයා විසින් තත් කාර්යය සඳහා කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි යම් ආකෘති පත්‍රයකට සාරානුකූලව ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

04. (1) 2011 වර්ෂය හෝ ඉන් පසුව එළඹෙන වර්ෂයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද රබර් නැවත වගා කිරීමේ බලපත්‍රයක් මත අනන්‍ය පෞද්ගලික හිමිකාරත්වයක් තිබෙන වත්තක හෝ කුඩා ඉඩමක නිශ්චිතව සඳහන් කරන ලද කිසියම් කොටසක රබර් නැවත වගා කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාර ප්‍රමාණය නැවත වගා කරනු ලැබිය යුතු එක් හෙක්ටයාරයක ප්‍රමාණයක් සඳහා රුපියල් එක් ලක්ෂ හැත්තෑ පන් දහසක් (රු.1,75,000/-) විය යුතු අතර එය පහත දැක්වෙන ආකාරයේ වාරික අටකින් ගෙවනු ලැබිය යුතු ය :–

(අ) නැවත වගා කිරීමට අවසර දී ඇති බිම් ප්‍රමාණයේ ඇති රබර් ගස් සහ අනෙකුත් වෘක්ෂලතාදිය මුලින් උදුරා දැමීමෙන් පසුව එසේ නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයේ එක් එක් හෙක්ටයාරයකට රුපියල් අට දහස (රු.8,000/-) බැගින් වූ පළමු වාරිකය ගෙවනු ලැබිය යුතු ය. තිබෙන්නා වූ රබර් ගස් උදුරා දැමීම සම්පූර්ණ කළ බව වත්තේ හෝ කුඩා ඉඩමේ අයිතිකරු විසින් රබර් පාලකවරයාට දැනුම් දුන්විට එම මුදලෙන් 50% ට නොවැඩි මුදලක් කොටස් වශයෙන් ගෙවිය හැකිය ;

(ආ) නැවත වගා කිරීම සම්පූර්ණ කළවිට, එක් එක් හෙක්ටයාරයකට රුපියල් හතලිස් තුන් දහස (රු. 43,000/-) බැගින් වූ දෙවන වාරිකය ගෙවිය යුතු ය. වගා කිරීම සම්පූර්ණ කළබව දැනුම් දුන් විට රබර් පාලකවරයා විසින් මෙම මුදලෙන් 50% ට නොවැඩි මුදලක් වත්තේ හෝ කුඩා ඉඩමේ අයිතිකරුට කොටස් ගෙවීමක් වශයෙන් ගෙවිය හැකිය. නැවත වගා කිරීමෙන් පසු පවත්වනු ලබන පරීක්ෂණයක දී වාරික මුදල් ලැබීමට සුදුසු පරිදි සියළුම අවශ්‍ය වැඩ කොටස් සම්පූර්ණ කොට නොමැති බව පෙනී ගියහොත් සතුටුදායක අන්දමින් සම්පූර්ණ කර ඇති අයිතමයන් වෙනුවෙන් පහත සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබිය හැකිය :–

| | | හෙක්ටයාරයකට රු. ශත |
|---|---|---|
| 1. | වලවල් හැරීම හා බද්ධ පැල සිටුවීම | 22,000.00 |
| 2. | පාංශු සංරක්ෂණ කටයුතු (අගල් කැපීම, ගල් වැටි හෝ වේදිකා ඉදිකිරීම) | 10,000.00 |
| 3. | ආවරණ බෝග වගා කිරීම | 3,000.00 |
| 4. | වැට බැඳීම | 8,000.00 |

ගෙවීමට ඇති ඉතිරි මුදලක් වේ නම් නිම නොකළ වැඩ කොටස් සම්පූර්ණ කළ පසු පමණක් ගෙවනු ලැබිය යුතුය. තවද, උක්ත වැඩ කොටස් සම්පූර්ණ කරන තුරු සෙසු ආධාර වාරික ගෙවීම් අත්හිටවිය යුතු ය;

(ඇ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් පහළොස් දහස (රු. 15,000/-) බැගින් වූ තුන් වැනි වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ගත වීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඈ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි එක් දහස් (රු. 21,000/-) බැගින් වූ හතර වැනි වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඉ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි එක් දහස (රු. 21,000/-) බැගින් වූ පස් වැනි වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඊ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි එක් දහස (රු. 21,000/-) බැගින් වූ හය වැනි වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හතරකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(උ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි දෙදහස (රු. 22,000/-) බැගින් වූ හත් වැනි වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු පහකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඌ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි හතරදහස (රු. 24,000/-) බැගින් වූ අට වැනි වාරිකය –

(i) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හයක කාලයක් ගතවීමට පෙර හා;

(ii) කිරි කැපීමට සුදුසු මට්ටමට වට ප්‍රමාණය වර්ධනය වී ඇති සියලුම රබර් ගස්වලට වැසි ආවරණ යොදන තෙක් ඉහත අට වැනි වාරිකය නොගෙවිය යුතු ය. කිරි කැපීමට සුදුසු මට්ටමට වට ප්‍රමාණය වර්ධනය වී ඇති ගස්වලට ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කරනු ලබන අයුරින් වැසි ආවරණ යොදනු ලැබිය යුතු අතර,

මේ නියෝගවල 08 වැනි නියෝගයේ (ආ) ජේදය සඳහා මෙය අදාළ නොවනු ඇත.

(2) එසේ වුව ද මෙම නියෝගයේ (1) ජේදයේ (ඇ) සිට (ඌ) දක්වා වූ ජේදවල නිශ්චිතව සඳහන් කර ඇති අවම ප්‍රමිතීන් එහි සඳහන් නියමිත කාලයට පෙරාතුව සම්පූර්ණ කර ඇති බවට රබර් පාලකවරයා සෑහීමකට පත් වන්නේ නම් ඔහුගේ අභිමතය පරිදි අදාළ වාරිකය නියමිත කාලයට පෙර මුදා හල හැකි ය.

(3) රබර් පැල නැවත සිටුවා අවසන් කර අවුරුදු හයක් ඉක්මවූ පසු හෝ අදාළ වගාවෙහි කිරි කැපීම ආරම්භ කළ පසු ඉහත සඳහන් ආධාර වාරික කිසිවක් ගෙවීම කරනු නොලැබිය යුතුය. 8 වැනි නියෝගයේ 'අ' ජේදයට අදාළව එය වසර හතක් වේ. මෙම නියෝගය 2011 වර්ෂයේ හෝ ඉන් පසුව නිකුත් කරනු ලබන අවසරපත්‍ර සඳහා පමණක් වලංගු විය යුතු ය.

(4) ක්ෂේත්‍රයේ පැල සිටවූ දිනය නැවැත වගා කළ දිනය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(5) නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාරයකට වඩා අඩු වන අවස්ථාවක දී හෝ ඒ බිම් ප්‍රමාණය හෙක්ටයාරයකට වඩා අඩුවන බිම් කොටසක් ඇතුළත් වන අවස්ථාවක දී, හෝ ගෙවිය යුතු ආධාර මුදල ගණනය කිරීමේදී, එම බිම් ප්‍රමාණයට හෝ කොටසට හෝ අදාළ වන්නා වූ මෙම නියෝගයෙහි (1) වැනි ජේදයෙහි සඳහන් වන අනුප්‍රමාණ එම බිම් ප්‍රමාණය හෝ බිම් ප්‍රමාණයෙහි කොටස හෝ එක් හෙක්ටයාරයකට දරන්නා වූ අනුපාතය අනුව ගෙවීම සඳහා අදාළ විය යුතු ය.

(6) වගා කරන ලද ගස් සංඛ්‍යාව අතුරින් එසේ වගා කිරීමෙන් පසු පස්වන අවුරුද්ද අවසානයේ දී තිබිය යුතු අවම ගස් ප්‍රමාණයෙන් ගස් 2/3 ක පොළවේ සිට මැනීමේ දී සෙන්ටිමීටර් 121.92 ක් ඉහළින් කඳෙහි පරිධිය සෙන්ටිමීටර් 50.80 ක වට ප්‍රමාණයක් දරන බවට තත් කාර්යය සඳහා රබර් පාලකවරයා විසින් ලියවිල්ලකින් බලය දෙනලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් මත එක් හෙක්ටයාරයකට රුපියල් හත් දහසක (රු. 7,000/- ක) දිරි ගැන්වීමේ දීමනාවක්, ගෙවනු ලැබිය හැකි ය.

(7) (මෙහි මින්මතු 'අවසරපත්‍රධරයා' යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ඉඩමක රබර් නැවත වගා කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් අයිතිකරුවකු විසින් සහනාධාර වාරික ගෙවීමේ සහ සහනාධාර වාරික ආපසු අයකර ගැනීමේ කාර්යය සඳහා රාජ්‍ය හෝ පෞද්ගලික වාණිජ බැංකු ශාඛාවක ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යා යුතු ය.

05. (1) 10 වැනි නියෝගය යටතේ රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලබන විධාන, නියම, සීමා කිරීම් සහ තහනම් කිරීම් වලට අනුකූලව ක්‍රියා කිරීම සහ වගා කළ බිම් ප්‍රමාණය හොඳ කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වාගෙනයාම 4 වැනි නියෝගය යටතේ සහනාධාරයේ පළමු වැනි වාරිකය ලැබූ සෑම අවසරපත්‍රධරයකුගේ ම කාර්යය විය යුතු ය.

(2) නැවත වගා කිරීමට අවසර පත්‍රයක් නිකුත් කරන ලද බිම් ප්‍රමාණයක් වෙනුවෙන් 4 වැනි නියෝගය යටතේ සහනාධාරය එක් වාරිකයක් හෝ ඊට වැඩි ගණනාවක් තවදුරටත් ගෙවනු ලැබීමට ඉතිරිව ඇති යම් අවසරපත්‍රධරයකු විසින් රබර් පාලකවරයාගේ ලිඛිත අනුමතය නොමැතිව එම මුලු බිම් ප්‍රමාණය හෝ ඉන් කොටසක් හෝ විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම හෝ නොකළ යුතු ය.

06. (1) යම් ඉඩමක නැවත රබර් වගා කිරීම සඳහා 4 වැනි නියෝගය යටතේ සහනාධාරයේ පළමු වාරිකය ගෙවන ලද ඕනෑම අවසරපත්‍රධරයකු විසින් වර්ෂයක් ඇතුළත හෝ රබර් පාලකවරයා විසින් දෙනු ලැබිය හැකි තවදුරටත් වූ කාලයක් ඇතුළත හෝ -

(අ) රබර් පාලකවරයා විසින් අනුමත කරන ලද යම් වර්ගයකට හෝ වර්ගවලට අයත් රබර් පැලවලින් එම බිම් ප්‍රමාණය වගා කිරීම සම්පූර්ණ කළ යුතු ය;

(ආ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මඟින් එසේ කිරීමට නියම කරනු ලැබ ඇත්නම් රබර් පැල හා භූමි ආවරණ රනිල පැලෑටි හැර සෙසු සියලු පැලෑටි ඒ බිම් ප්‍රමාණයෙන් ඉවත් කල යුතු ය;

(ඇ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි පරිදි කාණු හෝ ගල්වැටි හෝ ඒ බිම් ප්‍රමාණයේ තැනිය යුතු ය;

(ඈ) ඒ බිම් ප්‍රමාණයේ භූමි ආවරණ රනිල පැලෑටි සිටුවීම හෝ රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මඟින් නියම කරනු ලැබිය හැකි පරිදි පාංශු ඛාදනය වැලැක්වීම සඳහා වෙනත් යම් පියවර ගැනීම කළ යුතු ය;

(ඉ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මඟින් නියම කරනු ලැබ ඇත්නම් එම බිම් ප්‍රමාණය වටා වැටක් ඉදි කළ යුතු ය.

(2) (*a*) 6 වැනි නියෝග යටතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් වැඩ කොටසක් අයිතිකරු විසින් කරනු නොලැබූ අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින් එම වැඩ කොටස නිම කිරීම සඳහා අවශ්‍ය යයි ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි මිනිසුන් සේවයේ නියුක්ත කරවීම සහ අවශ්‍ය උපකරණ යෙදවීම කළ හැකිය.

(*b*) රබර් පාලකවරයා විසින් ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම් ඒ අයිතිකරුට ගෙවිය යුතු සහනාධාරවලින් අඩු කරනු ලැබිය යුතුය.

07. යම් ඉඩම් ප්‍රමාණයක් වෙනුවෙන් සහනාධාර හෝ ඉන් කොටසක් ගෙවනු ලැබූයේ යම් අවසරපත්‍රධරයකුට ද, ඒ සෑම අවසරපත්‍රධරයකු විසින් ම එම භූමියේ සෑම හෙක්ටයාරයක් තුළම නැවත වගා කළ යුතු අවම රබර් පැල සංඛ්‍යාව, සම්බන්ධයෙන් වූ පහත දැක්වෙන නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට වගබලා ගත යුතු අතර, ඉඩම් හෙක්ටයාර් එකකට වගා කළ යුතු අවම රබර් පැල සංඛ්‍යාව-

(අ) (i) නැවත වගා කරන අවස්ථාවක දී, රබර් පාලක විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ *RRIC* හා *RRISL* රබර් ක්ලෝන, වෙනත් වැඩි ඵලදාවක් ලබා දෙන බද්ධ රබර් පැල වර්ග වගාකර තිබේ නම් හෙක්ටයාරයකට 516 වැනි පරිදි; හා

(ii) නැවත වගා කිරීමෙන් පසුව ප්‍රථම වර්ෂය හා දෙවන වර්ෂය අවසානයේ හෙක්ටයාරයකට 516 ක් වන පරිදි ; හා

(iii) නැවත වගා කිරීමෙන් පසුව තෙවන වර්ෂය හා හතරවන වර්ෂය අවසානයේ හෙක්ටයාරයකට 475 ක් වන පරිදි;

(iv) නැවත වගා කිරීමෙන් පසු ඊලඟට එළඹෙන අනුක්‍රමික වර්ෂ දෙක අවසානයේ හෙක්ටයාරයකට 450ක් ලෙස;

(v) මෙම නියෝගවල 8 වැනි නියෝගයේ (ආ) ඡේදය සම්බන්ධයෙන් වන විට, වගා කිරීමෙන් පසුව එළඹෙන ඊලඟ අනුක්‍රමික වසර තුන සඳහා පැල 450ක් විය යුතු ය.

(ආ) බද්ධ කරන ලද රබර් පැල වගා කිරීම පහත දක්වා ඇති දුර ප්‍රමාණයන්ගෙන් හා දක්වා ඇති පැල සංඛ්‍යාවලින් යුතු විය යුතු ය :–

(i) *RRIC, RRISL* වර්ගයේ සහ වෙනත් වැඩි ඵලදාව සහිත රබර් ක්ලෝන වගා කිරීම සඳහා :

| | | |
|---|---|---|
| (i) සෙ.මී 350 x සෙ. මී 550 | හෙක්ටයාරයකට | 516 |
| (11'6" x 18') | (අක්කරයකට | 209) |
| (ii) සෙ.මී 430 x සෙ. මී 450 | හෙක්ටයාරයකට | 516 |
| (14' x 14' 9") | (අක්කරයකට | 209) |

(ii) *RRIC, RRISL* වර්ගයේ සහ වෙනත් වැඩි ඵලදාවක් ඇති බද්ධ රබර් පැල සමඟ අතුරු බෝග වගා කිරීම සඳහා

| | | |
|---|---|---|
| (ii) සෙ.මී 250 x සෙ. මී 775 | හෙක්ටයාරයකට | 516 |
| (8' x 25'6") | (අක්කරයකට | 209) |

(ඇ) ඉහත නියම කළ දුර ප්‍රමාණයන් නොසලකා ඉඩමේ පිහිටීම අනුව පැළ සිටුවීම සඳහා වෙනත් දුර ප්‍රමාණයන් රබර් පාලකවරයා විසින් අනුමත කළ හැකිය. එසේ වුව ද පැළ අතර අවම දුර ප්‍රමාණ මේ නියෝගයේ (ආ) ඡේදයේ (*i*) හා (*ii*) වන අනුඡේදවල නියමිත දුර ප්‍රමාණවල සංඛ්‍යාවට අනුකූල විය යුතුය.

08. යම් බිම් ප්‍රමාණයක වගා කරන ලද රබර් පැළ පොළවේ සිට සෙන්ටිමීටර් 121.92 ක උසින් තිබිය යුතු අවම වට ප්‍රමාණය පහත සඳහන් පරිදි පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම එම ඉඩම් කොටස වෙනුවෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති සෑම අවසරපත්‍රධරයකුගේ ම කාර්යය විය යුතු ය.

(අ) එම බිම් ප්‍රදේශය සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සෙන්ටිමීටර් 254 ක් සහ ඊට වැඩියෙන් ඇති දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක මෙහි පහත දැක්වෙන I වැනි තීරයේ සඳහන් පරිදි විය යුතු ය, සහ

| *I වැනි තීරය* | *සෙන්ටිමීටර්* |
|---|---|
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 15.87 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 25.40 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 31.75 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හයවන වර්ෂය අවසානයට වඩා පසු නොවන කාලයකදී | 50.80 |

(ආ) එම බිම් ප්‍රදේශය සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සෙන්ටිමීටර් 254 ක් සහ ඊට අඩුවෙන් ඇති දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක පහත දැක්වෙන II වැනි තීරයේ සඳහන් පරිදි විය යුතු ය.

| *II වැනි තීරය* | *සෙන්ටිමීටර්* |
|---|---|
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 13.97 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 22.86 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 27.94 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හත්වන වර්ෂය අවසානයට වඩා පසු නොවන කාලයකදී | 50.80 |

09. යම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ලැබූ කිසිදු අවසරපත්‍රධරයකු විසින් යම් බිම් ප්‍රමාණයක නැවත වගා කරන ලද රබර් පැළවලින් යටත් පිරිසෙයින් සියයට හැටක්වත් පොළොවේ සිට මැනීමේ දී, සෙන්ටිමීටර් එකසිය විසි එකයි දශම නවයයි දෙකක (121.92) උසින් අවම වශයෙන් සෙන්ටිමීටර් පනහයි දශම අටයි බින්දුවක (50.80) වට ප්‍රමාණය දක්වා වැඩෙන තෙක් රබර් ගස්වල කිරි කැපීම හෝ කිරි කැපීමට සැලැස්වීම නොකළ යුතු ය.

10. යම් අවසරපත්‍රධරයකු වෙත 4 වැනි නියෝගය යටතේ සහනාධාරයක් ගෙවිය හැකි හෝ කොටස් වශයෙන් ගෙවා ඇති අවස්ථාවක රබර් පාලකවරයා විසින් ඒ සඳහා ලිඛිත දැන්වීමකින් නියම කරනු ලබන කාලය ඇතුළත රබර් වත්තක හෝ කුඩා ඉඩමක හෝ සතුටුදායක අන්දමින් වගා කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි රබර් පාලකවරයා විසින් සළකනු ලබන්නාවූ ද, ඔහු විසින් ලිඛිතව නිකුත් කරනු ලබන්නා වූ ද විධාන, නියම, හෝ තහනම් කිරීම හෝ අනුව ඒ අවසරපත්‍රධරයා කටයුතු කළ යුතු ය.

11. රබර් පාලකවරයාගේ මතය අනුව :

(අ) සහනාධාරයක් හෝ ඉන් කොටසක් ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍රධරයකු විසින් 5 වැනි, 6 වැනි, 7 වැනි, 8 වැනි හෝ 9 වැනි නියෝගවල කවර හෝ විධානයන් කඩකර ඇති අවස්ථාවක, හෝ

(ආ) සහනාධාරය හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති අවසරපත්‍රධරයෙකුගේ නොසැලකිල්ල නිසා හෝ නිසි උද්යෝගයක් නොමැතිකම නිසා හෝ 8 වැනි නියෝගයෙහි නිශ්චිතව සඳහන් කර ඇති නියමවලට අනුකූල නොවන පරිදි බිම් ප්‍රදේශයක රබර් පැල නැවත වගා කර ඇති අවස්ථාවක, හෝ

(ඇ) සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍රධරයකු තමා වෙත 10 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් විධානයකට, නියමයකට, සීමා කිරීමකට හෝ තහනම් කිරීමකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක,

රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ අවසරපත්‍රධරයාට යම් භූමියක් සම්බන්ධයෙන් ගෙවනු ලැබ ඇති සහනාධාර මුදල නොපමාව නැතහොත් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් තුළ ආපසු ගෙවන ලෙස නියම කළ යුතු අතර, මේ නියෝගය යටතේ දැන්වීම භාරදෙනු ලැබූ කිසිදු අවසරපත්‍රධරයකු විසින් ඒ දැන්වීමට අනුකූලව කටයුතු කිරීම පැහැර නොහැරිය යුතු ය.

12. මේ නියෝගය යටතේ වූ බලතල පැවරීමේ බලය හැර රබර් පාලකවරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් මේ නියෝගය යටතේ තමා සතුවී ඇති හෝ තමාට නියමකර ඇති හෝ පවරා දී ඇති බලතල, කාර්යය හෝ කර්තව්‍යය අතරින් යම් බලයක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙකු වෙත පවරනු ලැබිය හැකිය.

13. (අ) මේ නියෝගවල 5 වැනි, 6 වැනි, 7 වැනි, 8 වැනි, 9 වැනි, 10 වැනි හෝ 11 වැනි නියෝගවල විධිවිධාන කඩකරන්නා වූ ; හෝ

(ආ) මේ නියෝග යටතේ වූ යම් ඉල්ලුම්පත්‍රයක හෝ ප්‍රකාශනයක අසත්‍ය බව තමන් දන්නා යම් වැදගත් කරුණක් ප්‍රකාශ කරන්නා වූ ; හෝ

(ඇ) සහනාධාරයක් ලබා ගැනීම ඉල්ලන ඉල්ලුම්කරුවෙකු හෝ සහනාධාර ලබා ගත්තකු හෝ වශයෙන් රබර් පාලකවරයා වෙත යම් අසත්‍ය තොරතුරක් සපයන්නා වූ ;

සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

14. (1) මේ නියෝග යටතේ රබර් පාලකවරයා විසින් සහනාධාර ලෙස යම් අවසරපත්‍රධරයකුට ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණ නැවත ආපසු ගෙවීමක් කර නොමැති විටකදී අධිකරණයක් මගින් පනවනු ලැබූ දඩයක් ලෙස එම මුදල් ප්‍රමාණය නැවත අයකර ගත හැකිය.

(2) සහනාධාර වාරික එකක් හෝ වැඩි ගණනක් ලබා ගැනීමෙන් අනතුරුව එම සහනාධාර ආපසු ගෙවීම පැහැර හරිමින් යම් තැනැත්තකු විසින් කුඩා ඉඩමක් හෝ වත්තක් අත්හැර දැමූ බවට රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඒ කරුණ පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

15. කලින් කල සංශෝධිත පරිදි, 1953 ඔක්තෝබර් මස 3 වැනි දින අංක 10594 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද 1953 රබර් නැවත වගා කිරීමේ සහනාධාර නියෝගවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පිළිවෙලින් 2005, 2006, 2007, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද රබර් නැවත වගා කිරීමේ යම් අවසරපත්‍රයක් මත ගෙවිය යුතු පහත සඳහන් සහනාධාර වාරික 4 වැනි නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති අනුප්‍රමාණ මත පහත දැක්වෙන ආකාරයට ගෙවනු ලැබිය යුතුය. එසේ වුව ද මෙම වාරික ගෙවිය යුත්තේ මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී එම අවසර පත්‍රය මත ගෙවිය යුතු වාරික සියල්ලම ගෙවා නොමැති නම් පමණි.

පුද්ගලික අයිතිය යටතේ ඇති වතු සහ කුඩා ඉඩම් :-

2005 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඌ) නියෝගයට අනුකූලව අටවන වාරිකය ;

2006 වර්ෂය - මෙම නියෝගවල 4(1)(උ) නියෝගයට අනුකූලව හත්වන වාරිකයේ සිට ඉදිරියට ;

2007 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඊ) නියෝගයට අනුකූලව හයවන වාරිකයේ සිට ඉදිරියට ;

2008 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඉ) නියෝගයට අනුකූලව පස්වන වාරිකයේ සිට ඉදිරියට ;

2009 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඈ) නියෝගයට අනුකූලව හතරවන වාරිකයේ සිට ඉදිරියට ;

2010 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඇ) නියෝගයට අනුකූලව තුන්වන වාරිකයේ සිට ඉදිරියට ;

2011 වර්ෂය - මෙම නියෝගවල 4(1)(අ) සහ/හෝ (ආ) නියෝගයවලට අනුකූලව පළමුවන වාරිකයේ සිට ඉදිරියට.

16. මෙම නියෝගවල -

"අයිතිකරු" යන්නට (436 වැනි අධිකාරය වූ) රබර් පාලන පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතුය.

"වත්ත" යන්නෙන්, රබර් ගස්වලින් කිරි එකතු කර ගැනීම සඳහා රබර් පැල වවනු ලබන විශාලත්වයෙන් හෙක්ටයාර් 4.04ට නොඅඩු ඉඩම් කොටසක් අදහස් වේ.

"නැවත වගා කිරීමේ අවසරපත්‍ර" යන්නෙන් (436 වැනි අධිකාරිය වූ) රබර් පාලන පනතේ 7(1) වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වේ.

"කුඩා ඉඩම" යන්නෙන් රබර් ගස්වලින් කිරි එකතු කර ගැනීම සඳහා රබර් පැල වවනු ලබන විශාලත්වයෙන් හෙක්ටයාර් 4.04කට අඩු ඉඩමේ කොටසක් අදහස් වේ. තව ද,

"රබර් පාලකවරයා" යන්නෙන් රබර් පාලන පනත යටතේ පත්කරන ලද හෝ පත්කරනු ලැබ ඇතැයි සලකනු ලබන රබර් පාලකවරයකු අදහස් වන අතර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ඇතුළත් වන්නේ ය.

10-299/1

---

එල්.ඩී.බී. 51/53 (III)

**(437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත**

(437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද සමරසිංහ,
වැවිලි කර්මාන්ත අමාත්‍ය.

2012 ක් වූ අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මේ නියෝග 2012 අංක 917/2 දරන අළුතින් රබර් වගා කිරීමේ සහනාධාර නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. යම් වත්තක හෝ කුඩා ඉඩමක අයිතිකරුවකු වන යම් තැනැත්තෙකු විසින් කරනු ලබන තත් කාර්යය සඳහා වූ ලිඛිත ඉල්ලීමක් මත, රබර් පාලකවරයා විසින් ඒ වත්තේ හෝ කුඩා ඉඩමේ පළමු වරට රබර් වගා කිරීමේ කාර්යය සඳහා (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) (437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලින් ඒ තැනැත්තාට සහනාධාරයක් මෙම නියෝගවල විධිවිධානවලට අනුකූලව ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

03. 2 වැනි නියෝගය යටතේ සහනාධාරයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, රබර් පාලකවරයා විසින් තත් කාර්යය සඳහා කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි යම් ආකෘති පත්‍රයකට සාරානුකූලව ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

04. (1) 2011 වර්ෂය හෝ ඉන් පසුව එළඹෙන වර්ෂයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද අළුත් රබර් වගා කිරීමේ බලපත්‍රයක් මත අනන්‍ය පෞද්ගලික හිමිකාරත්වයක් තිබෙන වත්තක හෝ කුඩා ඉඩමක නිශ්චිතව සඳහන් කරන ලද කිසියම් කොටසක පළමුවරට අළුතින් රබර් වගා කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාර ප්‍රමාණය අළුතින් රබර් වගා කරනු ලැබිය යුතු එක් හෙක්ටයාරයක ප්‍රමාණයක් සඳහා රුපියල් එක්ලක්ෂ පනස් දහසක් (රු.1,50,000) විය යුතු අතර එය පහත දැක්වෙන ආකාරයේ වාරික අටකින් ගෙවනු ලැබිය යුතු ය :–

(අ) අළුතින් වගා කිරීමට අවසර දී ඇති බිම් ප්‍රමාණයේ ඇති අනෙකුත් වෘක්ෂලතාදිය මුලින් උදුරා දැමීමෙන් පසුව හා පැල සිටුවීම සඳහා වලවල් පිළියෙල කිරීමෙන් පසු එසේ වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයේ එක් එක් හෙක්ටයාරයකට රුපියල් හය දහසක් (රු.6,000/) බැගින් වූ පළමු වාරිකය ගෙවනු ලැබිය යුතුය ;

(ආ) අළුතින් වගා කිරීම සම්පූර්ණ කළවිට, එක් එක් හෙක්ටයාරයකට රුපියල් තිස්හය දහස (රු. 36,000/) බැගින් වූ දෙවන වාරිකය ගෙවිය යුතු ය, වගා කිරීම සම්පූර්ණ කළබව දැනුම් දුන් විට රබර් පාලකවරයා විසින් මෙම මුදලෙන් 50% ට නොවැඩි මුදලක් වත්තේ හෝ කුඩා ඉඩමේ අයිතිකරුට කොටස් ගෙවීමක් වශයෙන් ගෙවිය හැකිය, අළුතෙන් වගා කිරීමෙන් පසු පවත්වනු ලබන පරීක්ෂණයේ දී වාරික මුදල් ලැබීමට සුදුසු පරිදි සියළුම අවශ්‍ය වැඩ කොටස් සම්පූර්ණ කොට නොමැති බව පෙනී ගියහොත් සතුටුදායක අන්දමින් සම්පූර්ණ කර ඇති අයිතමයන් වෙනුවෙන් පහත සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබිය හැකිය :–

| | හෙක්ටයාරයකට රු. ශත |
|---|---|
| 1. වලවල් හෑරීම හා බද්ධ පැල සිටුවීම | 18,000.00 |
| 2. පාංශු සංරක්ෂණ කටයුතු (අගල් කැපීම, ගල් වැටි හෝ වේදිකා ඉදිකිරීම) | 8,000.00 |
| 3. ආවරණ බෝග වගා කිරීම | 2,000.00 |
| 4. වැට බැඳීම | 8,000.00 |

ගෙවීමට ඇති ඉතිරි මුදලක් වේ නම් නිම නොකළ වැඩ කොටස් සම්පූර්ණ කළ පසුව පමණක් ගෙවනු ලැබිය යුතුය. තවද, උක්ත වැඩ කොටස් සම්පූර්ණ කරන තුරු සෙසු ආධාර වාරික ගෙවීම් අත්හිටවිය යුතු ය;

(ඇ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් දොලොස් දහස (රු. 12,000/) බැගින් වූ තුන්වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ගත වීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඈ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් දහ අට දහස (රු. 18,000/) බැගින් වූ හතර වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඉ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් දහ අට දහස (රු. 18,000/) බැගින් වූ පස්වන වාරිකය අළුතින් වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඊ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් දහ අට දහස (රු. 18,000/) බැගින් වූ හයවන වාරිකය අළුතින් වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හතරකට නොඅඩු කායලක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(උ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් දහ නව දහස (රු. 19,000/) බැගින් වූ හත්වන වාරිකය අළුතින් වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු පහකට නොඅඩු කායලක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඌ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි තුන් දහස (රු. 23,000/) බැගින් වූ අටවන වාරිකය –

(i) අළුතින් වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හයක කාලයක් ගතවීමට පෙර ; හා

(ii) කිරි කැපීමට සුදුසු මට්ටමට වට ප්‍රමාණය වර්ධනය වී ඇති සියලුම රබර් ගස්වලට වැසි ආවරණ යොදන තෙක් අටවන වාරිකය නොගෙවිය යුතු ය. කිරි කැපීමට සුදුසු මට්ටමට වට ප්‍රමාණය වර්ධනය වී ඇති ගස්වලට ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කරනු ලබන අයුරින් වැසි ආවරණ යොදනු ලැබිය යුතු අතර,

මේ නියෝගවල 08 වන නියෝගයේ (ආ) ඡේදය සඳහා මෙය අදාළ නොවනු ඇත.

(2) එසේ වුවද මෙම නියෝගයේ (1) ඡේදයේ (ඇ) සිට (ඌ) දක්වා වූ ඡේදවල නිශ්චිතව සඳහන් කර ඇති අවම ප්‍රමිතීන් එහි සඳහන් නියමිත කාලයට පෙරාතුව සම්පූර්ණ කර ඇති බවට රබර් පාලකවරයා සෑහීමකට පත් වන්නේ නම් ඔහුගේ අභිමතය පරිදි අදාළ වාරිකය නියමිත කාලයට පෙර මුදා හල හැකිය.

(3) රබර් පැල අළුතින් සිටුවා අවසන් කර අවුරුදු හයක් ඉක්මවූ පසු හෝ අදාළ වගාවෙහි කිරි කැපීම ආරම්භ කළ පසු ඉහත සඳහන් ආධාර වාරික කිසිවක් ගෙවීම කරනු නොලැබිය යුතුය. 8 වන නියෝගයේ 'ආ' ඡේදයට අදාළව එය වසර හතක් වේ. මෙම නියෝගය 2011 වර්ෂයේ හෝ ඉන් පසුව නිකුත් කරනු ලබන අළුතින් වගා කිරීමේ අවසරපත්‍ර සඳහා පමණක් වලංගු විය යුතු ය.

(4) ක්ෂේත්‍රයේ පැල සිටවූ දිනය අළුතින් වගා කළ දිනය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(5) අළුතින් වගා කිරීමට ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාරයකට වඩා අඩු වන අවස්ථාවක දී හෝ ඒ බිම් ප්‍රමාණයට හෙක්ටයාරයකට වඩා අඩුවන බිම් කොටසක් ඇතුළත් වන අවස්ථාවකදී, හෝ ගෙවිය යුතු ආධාර මුදල ගණනය කිරීමේදී, එම බිම් ප්‍රමාණයට හෝ කොටසට හෝ අදාළ වන්නා වූ මෙම නියෝගයෙහි (1) වන ඡේදයෙහි සඳහන් වන අනුප්‍රමාණ එම බිම් ප්‍රමාණය හෝ බිම් ප්‍රමාණයෙහි කොටස හෝ එක් හෙක්ටයාරයකට දරන්නා වූ අනුපාතය අනුව ගෙවීම සඳහා අදාළ විය යුතු ය.

(6) වගා කරන ලද ගස් සංඛ්‍යාව අතුරින් එසේ වගා කිරීමෙන් පසු පස්වන අවුරුද්ද අවසානයේ දී තිබිය යුතු අවම ගස් ප්‍රමාණයෙන් ගස් 2/3 ක පොළවේ සිට මැනීමේ දී සෙන්ටිමීටර් 121.92 ක් ඉහළින් කඳෙහි පරිධිය සෙන්ටිමීටර් 50.80 ක වට ප්‍රමාණයක් දරන බවට තත් කාර්යය සඳහා රබර් පාලකවරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් මත එක් හෙක්ටයාරයකට රුපියල් හත් දහසක (රු. 7,000/ක) දිරි ගැන්වීමේ දීමනාවක්, ගෙවනු ලැබිය හැකිය.

(7) (මෙහි මින්මතු 'අවසරපත්‍රධාරයා' යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ඉඩමක රබර් අළුතින් වගා කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් අයිතිකරුවකු විසින් සහනාධාර වාරික ගෙවීමේ සහ සහනාධාර වාරික ආපසු ගැනීමේ කාර්යය සඳහා රාජ්‍ය හෝ පෞද්ගලික වාණිජ බැංකු ශාඛාවක ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යා යුතුය.

05. (1) 10 වන නියෝගය යටතේ රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලබන විධාන, නියම, සීමා කිරීම් සහ තහනම් කිරීම් වලට අනුකූලව ක්‍රියා කිරීම සහ අළුතින් වගා කල බිම් ප්‍රමාණය හොඳ කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වාගෙන යාම 4 වන නියෝගය යටතේ සහනාධාරයේ පළමුවන වාරිකය ලැබූ සෑම අවසරපත්‍රධරයකුගේ ම කාර්යය විය යුතු ය.

(2) අළුතින් වගා කිරීමට අවසර පත්‍රයක් නිකුත් කරන ලද බිම් ප්‍රමාණයක් වෙනුවෙන් 4 වන නියෝගය යටතේ සහනාධාරය එක් වාරිකයක් හෝ ඊට වැඩි ගණනාවක් තවදුරටත් ගෙවනු ලැබීමට ඉතිරිව ඇති යම් අවසරපත්‍රධරයකු විසින් රබර් පාලකවරයාගේ ලිඛිත අනුමතය නොමැතිව එම මුළු බිම් ප්‍රමාණය හෝ ඉන් කොටසක් හෝ විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම හෝ නොකළ යුතු ය.

06. (1) අළුතින් රබර් වගා කිරීම සඳහා වූ අවසර පත්‍රයක් දරන්නෙකු විසින් වර්ෂයක් ඇතුළත හෝ රබර් පාලකවරයා විසින් තවදුරටත් දෙන ලැබිය හැකි කාලයක් ඇතුළත හෝ වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි ඇති වෘක්ෂලතාදිය මුලින් උදුරා දැමීම කර -

(අ) රබර් පාලකවරයා විසින් අනුමත කරන ලද යම් වර්ගයකට හෝ වර්ගවලට අයත් රබර් පැළවලින් එම බිම් ප්‍රමාණය වගා කිරීම සම්පූර්ණ කළ යුතු ය;

(ආ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් එසේ කිරීමට නියම කරනු ලැබ ඇත්නම් රබර් පැළ හා භූමි ආවරණ රනිල පැලෑටි හැර සෙසු සියලු පැලෑටි ඒ බිම් ප්‍රමාණයෙන් ඉවත් කළ යුතු ය;

(ඇ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් කරනු ලැබිය හැකි පරිදි කාණු හෝ ගල්වැටි හෝ ඒ බිම් ප්‍රමාණයේ තැනිය යුතු ය;

(ඈ) ඒ බිම් ප්‍රමාණයේ භූමි ආවරණ රනිල පැලෑටි සිටුවීම හෝ රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මඟින් නියම කරනු ලැබිය හැකි පරිදි පාංශු ඛාදනය වැළැක්වීම සඳහා වෙනත් යම් පියවර ගැනීම කළ යුතු ය;

(ඉ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මඟින් නියම කරනු ලැබ ඇත්නම් එම බිම් ප්‍රමාණය වටා වැටක් ඉදි කළ යුතු ය.

(2) (*a*) 6 වන නියෝග යටතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් වැඩ කොටසක් අයිතිකරු විසින් කරනු නොලැබූ අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින් එම වැඩ කොටස නිම කිරීම සඳහා අවශ්‍ය යයි ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි මිනිසුන් සේවයේ නියුක්ත කරවීම සහ අවශ්‍ය උපකරණ යෙදවීම කළ හැකිය ;

(*b*) රබර් පාලකවරයා විසින් ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම් ඒ අයිතිකරුට ගෙවිය යුතු සහනාධාරවලින් අඩු කරනු ලැබිය යුතු ය.

07. යම් ඉඩම් ප්‍රමාණයක් වෙනුවෙන් සහනාධාර හෝ ඉන් කොටසක් ගෙවනු ලැබූයේ යම් අවසරපත්‍රධරයකුට ද, ඒ සෑම අවසරපත්‍රධරයකු විසින් ම එම භූමියේ සෑම හෙක්ටයාරයක් තුළම නැවත වගාකළ යුතු අවම රබර් පැළ සංඛ්‍යාව, සම්බන්ධයෙන් වූ පහත දැක්වෙන නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට වගබලා ගත යුතු අතර, ඉඩම් හෙක්ටයාර් එකකට වගා කළ යුතු අවම රබර් පැළ සංඛ්‍යාව

(අ) (i) අළුතින් වගා කිරීමේ කවර හෝ අවස්ථාවක දී, රබර් පාලක විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ *(RRIC* හා *RRISL)* රබර් ක්ලෝන, වෙනත් වැඩි ඵලදාවක් ලබා දෙන බද්ධ රබර් පැළ වර්ග වගාකර තිබේ නම් හෙක්ටයාරයකට 516 වන පරිදි ; හා

(ii) වගා කිරීමෙන් පසුව ප්‍රථම වර්ෂය හා දෙවන වර්ෂය අවසානයේ හෙක්ටයාරයකට 516 වන පරිදි ; හා

(iii) වගා කිරීමෙන් පසුව තෙවන වර්ෂය හා හතරවන වර්ෂය අවසානයේ හෙක්ටයාරයකට 475 ක් වන පරිදි;

(iv) වගා කිරීමෙන් පසු ඊළඟට එළඹෙන අනුක්‍රමික වර්ෂ දෙක අවසානයේ හෙක්ටයාරයකට 450ක් ලෙස;

(v) මෙම නියෝගවල 8 වන නියෝගයේ (ආ) ඡේදය සම්බන්ධයෙන් වන විට, වගා කිරීමෙන් පසුව එළඹෙන ඊළඟ අනුක්‍රමික වසර තුන සඳහා පැළ 450ක් විය යුතු ය.

(ආ) බද්ධ කරන ලද රබර් පැළ වගා කිරීම පහත දක්වා ඇති දුර ප්‍රමාණයන්ගෙන් හා දක්වා ඇති පැළ සංඛ්‍යාවලින් යුතු විය යුතු ය :–

(i) *RRIC, RRISL* වර්ගයේ සහ වෙනත් වැඩි ඵලදාව සහිත රබර් ක්ලෝන වගා කිරීම සඳහා :

| | | |
|---|---|---|
| (i) සෙ.මී. 350 x සෙ. මී. 550 | හෙක්ටයාරයකට | 516 |
| (11'6" x 18') | (අක්කරයකට | 209) |
| (ii) සෙ.මී 430 x සෙ. මී 450 | හෙක්ටයාරයකට | 516 |
| (14" x 14'9") | (අක්කරයකට | 209) |

(ii) *RRIC, RRISL* සහ වෙනත් වැඩි ඵලදාවක් සහිත රබර් ක්ලෝන සමඟ අතුරු බෝග වගා කිරීම සඳහා :

| | | |
|---|---|---|
| (ii) සෙ.මී 250 x සෙ. මී 775 | හෙක්ටයාරයකට | 516 |
| (8' x 26') | (අක්කරයකට | 209) |

(*ඇ*) ඉහත නියම කළ දුර ප්‍රමාණයන් නොසලකා ඉඩමේ පිහිටීම අනුව පැළ සිටුවීම සඳහා වෙනත් දුර ප්‍රමාණයන් රබර් පාලකවරයා විසින් අනුමත කළ හැකිය. එසේ වුවද මේ නියෝගයේ (*ආ*) ඡේදයේ (*i*) හා (*ii*) වන අනු ඡේදවල නියමිත දුර ප්‍රමාණවල පැළ සංඛ්‍යාවට වඩා අඩු නොවිය යුතුය.

08. යම් බිම් ප්‍රමාණයක වගා කරන ලද රබර් පැළ පොළවේ සිට සෙන්ටිමීටර් 121.92 ක උසින් හා අවම වට ප්‍රමාණය පහත සඳහන් පරිදි පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම එම ඉඩම් කොටස වෙනුවෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති සැම අවසරපත්‍රධරයකුගේ ම කාර්යය විය යුතු ය

(*අ*) එම බිම් ප්‍රදේශ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සෙන්ටිමීටර් 254 ක් සහ ඊට වැඩියෙන් ඇති දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක මෙහි පහත දැක්වෙන I වන තීරයේ සඳහන් පරිදි විය යුතු ය, සහ

| *I වන තීරය* | *සෙන්ටිමීටර්* |
|---|---|
| අළුතින් වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| අළුතින් වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 15.87 |
| අළුතින් වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 25.40 |
| අළුතින් වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 31.75 |
| අළුතින් වගා කිරීමෙන් පසු එළඹෙන හයවන වර්ෂය අවසානයට වඩා පසු නොවන කාලයකදී | 50.80 |

(*ආ*) එම බිම් ප්‍රදේශය සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සෙන්ටිමීටර් 254 ක් සහ ඊට අඩුවෙන් ඇති දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක පහත දැක්වෙන I I වන තීරයේ සඳහන් පරිදි විය යුතු ය.

| *I වන තීරය* | *සෙන්ටිමීටර්* |
|---|---|
| අළුතින් වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| අළුතින් වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 13.97 |
| අළුතින් වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 22.86 |
| අළුතින් වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 27.94 |
| අළුතින් වගා කිරීමෙන් පසු එළඹෙන හත්වන වර්ෂය අවසානයට වඩා පසු නොවන කාලයකදී | 50.80 |

09. යම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ලැබූ කිසිදු අවසරපත්‍රධරයකු විසින් යම් බිම් ප්‍රමාණයක වගා කරන ලද රබර් පැළවලින් යටත් පිරිසෙයින් සියයට හැටක්වත් පොළොවේ සිට මැනීමේ දී, සෙන්ටිමීටර් එකසිය විසි එකයි දශම නවයයි දෙකක (121.92) උසින් අවම වශයෙන් සෙන්ටිමීටර් පනහයි දශම අටයි බින්දුවක (50.80) වට ප්‍රමාණය දක්වා වැඩෙන තෙක් රබර් ගස්වල කිරි කැපීම හෝ කිරි කැපීමට සැළැස්වීම නොකළ යුතු ය.

10. යම් අවසරපත්‍රධරයකු වෙත 4 වන නියෝගය යටතේ සහනාධාරයක් ගෙවිය හැකි හෝ කොටස් වශයෙන් ගෙවා ඇති අවස්ථාවක රබර් පාලකවරයා විසින් ඒ සඳහා ලිඛිත දැන්වීමකින් නියම කරනු ලබන කාලය ඇතුළත රබර් වත්තක හෝ කුඩා ඉඩමක හෝ සතුටුදායක අන්දමින් අළුතින් වගා කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි රබර් පාලකවරයා විසින් සළකනු ලබන්නාවූ ද, ඔහු විසින් ලිඛිතව නිකුත් කරනු ලබන්නා වූ ද විධාන, නියම, හෝ තහනම් කිරීම හෝ අනුව ඒ අවසරපත්‍රධරයා කටයුතු කළ යුතු ය.

11. රබර් පාලකවරයාගේ මතය අනුව ඃ

(*අ*) සහනාධාරයක් හෝ ඉන් කොටසක් ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍රධරයකු විසින් 5 වන, 6 වන, 7 වන, 8 වන හෝ 9 වන නියෝගවල කවර හෝ විධානයන් කඩකර ඇති අවස්ථාවක ; හෝ

(ආ) සහනාධාරය හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති අවසරපත්‍රධරයෙකුගේ නොසැලකිල්ල නිසා හෝ නිසි උද්යෝගයක් නොමැතිකම නිසා හෝ 8 වන නියෝගයෙහි නිශ්චිතව සඳහන් කර ඇති නියමවලට අනුකූල නොවන පරිදි බිම් ප්‍රදේශයක රබර් පැළ වගා කර ඇති අවස්ථාවක ; හෝ

(*ඇ*) සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍රධරයකු තමා වෙත 10 වන නියෝගය යටතේ නිකුත් කරන ලද යම් විධානයක, නියමයක, සීමා කිරීමකට හෝ තහනම් කිරීමකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක,

රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ අවසරපත්‍රධරයාට යම් භූමියක් සම්බන්ධයෙන් ගෙවනු ලැබ ඇති සහනාධාර මුදල නොපමාව නැතහොත් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් තුළ ආපසු ගෙවන ලෙස නියම කළ යුතු අතර, මේ නියෝගය යටතේ දැන්වීම භාරදෙනු ලැබූ කිසිදු අවසරපත්‍රධරයකු විසින් ඒ දැන්වීමට අනුකූලව කටයුතු කිරීම පැහැර නොහැරිය යුතු ය.

12. මේ නියෝගය යටතේ වූ බලතල පැවරීමේ බලය හැර රබර් පාලකවරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් මේ නියෝගය යටතේ තමා සතුවී ඇති හෝ තමාට නියමකර ඇති හෝ පවරා දී ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතරින් යම් බලයක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියකු වෙත පවරනු ලැබිය හැකිය.

13. (අ) මේ නියෝගවල 5 වැනි, 6 වැනි, 7 වැනි, 8 වැනි, 9 වැනි, 10 වැනි හෝ 11 වන නියෝගවල විධිවිධාන කඩකරන්නා වූ ; හෝ

(ආ) මේ නියෝග යටතේ වූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ ප්‍රකාශනයක අසත්‍ය බව තමන් දන්නා යම් වැදගත් කරුණක් ප්‍රකාශ කරන්නා වූ ; හෝ

(ඇ) සහනාධාරයක් ලබා ගැනීම ඉල්ලන ඉල්ලුම්කරුවකු හෝ සහනාධාර ලබා ගත්තකු හෝ වශයෙන් රබර් පාලකවරයා වෙත යම් අසත්‍ය තොරතුරක් සපයන්නා වූ

සෑම තැනැත්තෙකුම වරදකට වරදකරුවන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

14. (1) මේ නියෝග යටතේ රබර් පාලකවරයා විසින් සහනාධාර ලෙස යම් අවසරපත්‍රධරයකුට ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණ නැවත ආපසු ගෙවීමක් කර නොමැති විටකදී අධිකරණයක් මගින් පනවනු ලැබූ දඩයක් ලෙස එම මුදල් ප්‍රමාණය නැවත අයකර ගත හැකිය.

(2) සහනාධාර වාරික එකක් හෝ වැඩි ගණනක් ලබා ගැනීමෙන් අනතුරුව එම සහනාධාර ආපසු ගෙවීම පැහැර හරිමින් යම් තැනැත්තකු විසින් කුඩා ඉඩමක් හෝ වත්තක් අත්හැර දැමූ බවට රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඒ කරුණ පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

15. කලින් කල සංශෝධිත පරිදි, 1977 මාර්තු මස 23 වැනි දින අංක 258 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර නියෝගවල විධිවිධානවල කුමක් සඳහන් වුවද, පිළිවෙලින් 2005, 2006, 2007, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද රබර් අලුතෙන් වගා කිරීමේ යම් අවසරපත්‍රයක් මත ගෙවිය යුතු පහත සඳහන් සහනාධාර වාරික 4 වැනි නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති අනුප්‍රමාණ මත පහත දැක්වෙන ආකාරයට ගෙවනු ලැබිය යුතුය : එසේ වුවද මෙම වාරික ගෙවිය යුත්තේ මේ නියෝග ක්‍රියාත්මකවීම ආරම්භවන අවස්ථාවේ දී එම අවසර පත්‍රය මත ගෙවිය යුතු වාරික සියල්ලම ගෙවා නොමැති නම් පමණි.

පුද්ගලික අයිතිය යටතේ ඇති වතු සහ කුඩා ඉඩම් :-

2005 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඌ) නියෝගයට අනුකූලව අටවන වාරිකය ;
2006 වර්ෂය - මෙම නියෝගවල 4(1)(උ) නියෝගයට අනුකූලව හත්වන වාරිකයේ සිට ඉදිරියට ;
2007 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඊ) නියෝගයට අනුකූලව හයවන වාරිකයේ සිට ඉදිරියට ;
2008 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඉ) නියෝගයට අනුකූලව පස්වන වාරිකයේ සිට ඉදිරියට ;
2009 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඈ) නියෝගයට අනුකූලව හතරවන වාරිකයේ සිට ඉදිරියට ;
2010 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඇ) නියෝගයට අනුකූලව තුන්වන වාරිකයේ සිට ඉදිරියට ;
2011 වර්ෂය - මෙම නියෝගවල 4(1)(අ) සහ/හෝ (ආ) නියෝගවලට අනුකූලව පළමුවන වාරිකයේ සිට ඉදිරියට.

*16.* *මෙම නියෝගවල -*

"අයිතිකරු" යන්නට, (436 වැනි අධිකාරය වූ) රබර් පාලන පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතුය;

"වත්ත" යන්නෙන්, රබර් ගස්වලින් කිරි එකතු කර ගැනීම සඳහා රබර් පැල වවනු ලබන විශාලත්වයෙන් හෙක්ටයාර් 4.04ට නොඅඩු ඉඩම් කොටසක් අදහස් වේ;

"අලුතින් වගා කිරීමේ අවසර පත්‍ර" යන්නෙන්, (436 වැනි අධිකාරය වූ) රබර් පාලන පනතේ 7(1) වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වේ ;

"කුඩා ඉඩම" යන්නෙන්, රබර් ගස් වලින් කිරි එකතු කර ගැනීම සඳහා රබර් පැල වවනු ලබන විශාලත්වයෙන් හෙක්ටයාර් 4.04කට අඩු ඉඩමේ කොටසක් අදහස් වේ. තව ද,

"රබර් පාලකවරයා" යන්නෙන්, රබර් පාලන පනත යටතේ පත්කරන ලද හෝ පත්කරනු ලැබ ඇතැයි සලකනු ලබන රබර් පාලකවරයකු අදහස් වන අතර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ඇතුළත් වන්නේ ය.

10-299/2

---

එල්.ඩී.බී. 51/53 (III).

**(437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත**

(437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද සමරසිංහ,
වැවිලි කර්මාන්ත අමාත්‍ය.

2012 ක් වූ අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මේ නියෝග "2012 අංක 917/3 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර වැවිලි සමාගම් නියෝග" යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. යම් වත්තක අයිතිකරුවකු වන යම් තැනැත්තෙකු විසින් කරනු ලබන තත් කාර්යය සඳහා වූ ලිඛිත ඉල්ලීමක් මත, රබර් පාලකවරයා විසින් ඒ වත්තේ රබර් නැවත වගා කිරීමේ කාර්යය සඳහා (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) (437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලින් ඒ තැනැත්තාට සහනාධාරයක් මෙම නියෝගවල විධිවිධානවලට අනුකූලව ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

03. 2 වැනි නියෝගය යටතේ සහනාධාරයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, රබර් පාලකවරයා විසින් තත් කාර්යය සඳහා කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි යම් ආකෘති පත්‍රයකට සාරානුකූලව ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

04. (1) 2011 වර්ෂය හෝ ඉන් පසුව එළඹෙන වර්ෂයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද රබර් නැවත වගා කිරීමේ බලපත්‍රයක් මත අනන්‍ය පෞද්ගලික හිමිකාරත්වයක් තිබෙන වත්තක හෝ කුඩා ඉඩමක නිශ්චිතව සඳහන් කරන ලද කිසියම් කොටසක රබර් නැවත වගා කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාර ප්‍රමාණය නැවත වගා කරනු ලැබිය යුතු එක් හෙක්ටයාරයක ප්‍රමාණයක් සඳහා රුපියල් එක් ලක්ෂ හැත්තෑ පන් දහසක් (රු.1,75,000/) විය යුතු අතර එය පහත දැක්වෙන ආකාරයේ වාරික අටකින් ගෙවනු ලැබිය යුතු ය :–

(අ) අළුතින් වගා කිරීමට අවසර දී ඇති බිම් ප්‍රමාණයේ ඇති රබර් ගස් සහ අනෙකුත් වෘක්ෂලතාදිය මුලින් උදුරා දැමීමෙන් පසුව එක් හෙක්ටයාරයකට රුපියල් අට දහසක් (රු.8,000/) බැගින් වූ පළමු වාරිකය ගෙවිය යුතුය. තිබෙන්නා වූ රබර් ගස් උදුරා දැමීම සම්පූර්ණ කළ බව වතතේ අයිතිකරු විසින් රබර් පාලකවරයාට දැනුම් දුන් විට එම මුදලින් 50%කට නොවැඩි මුදලක් කොටස් ගෙවීමක් වශයෙන් ගෙවිය හැකිය ;

(ආ) නැවත වගා කිරීම සම්පූර්ණ කළවිට, එක් එක් හෙක්ටයාරයකට රුපියල් හතලිස් තුන් දහස (රු. 43,000) බැගින් වූ දෙවන වාරිකය ගෙවිය යුතු ය, වගා කිරීම සම්පූර්ණ කලබව දැනුම් දුන් විට රබර් පාලකවරයා විසින් මෙම මුදලෙන් 50% ට නොවැඩි මුදලක් වත්තේ අයිතිකරුට කොටස් ගෙවීමක් වශයෙන් ගෙවිය හැකිය, නැවත වගා කිරීමෙන් පසු පවත්වනු ලබන පරීක්ෂණයක දී වාරික මුදල් ලැබීමට සුදුසු පරිදි සියළුම අවශ්‍ය වැඩ කොටස් සම්පූර්ණ කොට නොමැති බව පෙනී ගියහොත් සතුටුදායක අන්දමින් සම්පූර්ණ කර ඇති අයිතමයන් වෙනුවෙන් පහත සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබිය හැකිය :–

| | | හෙක්ටයාරයකට රු. ශත |
|---|---|---|
| 1. | වලවල් හෑරීම හා බද්ධ පැල සිටුවීම | 22,000.00 |
| 2. | පාංශු සංරක්ෂණ කටයුතු (අගල් කැපීම, ගල් වැටි හෝ වේදිකා ඉදිකිරීම) | 10,000.00 |
| 3. | ආවරණ බෝග වගා කිරීම | 3,000.00 |
| 4. | වැට බැඳීම | 8,000.00 |

ගෙවීමට ඇති ඉතිරි මුදලක් වේ නම්, නිම නොකළ වැඩ කොටස් සම්පූර්ණ කළ පසු පමණක් ගෙවනු ලැබිය යුතුය. තවද, උක්ත වැඩ කොටස් සම්පූර්ණ කරන තුරු සෙසු ආධාර වාරික ගෙවීම් අත්හිටවිය යුතු ය;

(ඇ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් පහළොස් දහස (රු. 15,000) බැගින් වූ තුන්වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ගත වීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඈ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි එක් දහස (රු. 21,000) බැගින් වූ හතර වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඉ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි එක් දහස (රු. 21,000) බැගින් වූ පස්වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඊ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි එක් දහස (රු. 21,000) බැගින් වූ හයවන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හතරකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(උ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි දෙදහස (රු. 22,000) බැගින් වූ හත්වන වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු පහකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඌ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් විසි හතරදහස (රු. 24,000) බැගින් වූ අටවන වාරිකය –

(i) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හයක කාලයක් ගතවීමට පෙර ; හා

(ii) කිරි කැපීමට සුදුසු මට්ටමට වට ප්‍රමාණය වර්ධනය වී ඇති සියලුම රබර් ගස්වලට වැසි ආවරණ යොදන තෙක් ඉහත අටවන වාරිකය නොගෙවිය යුතු ය. කිරි කැපීමට සුදුසු මට්ටමට වට ප්‍රමාණය වර්ධනය වී ඇති ගස්වලට ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කරනු ලබන අයුරින් වැසි ආවරණ යොදනු ලැබිය යුතු අතර,

මේ නියෝගවල 08 වැනි නියෝගයේ (ආ) ඡේදය සඳහා මෙය අදාළ නොවනු ඇත.

(2) එසේ වුවද මෙම නියෝගයේ (1) ඡේදයේ (ඇ) සිට (ඌ) දක්වා වූ ඡේදවල නිශ්චිතව සඳහන් කර ඇති අවම ප්‍රමිතීන් එහි සඳහන් නියමිත කාලයට පෙරාතුව සම්පූර්ණ කර ඇති බවට රබර් පාලකවරයා සෑහීමකට පත් වන්නේ නම් ඔහුගේ අභිමතය පරිදි අදාළ වාරිකය නියමිත කාලයට පෙර මුදා හල හැකිය.

(3) රබර් පැල නැවත සිටුවා අවසන් කර අවුරුදු හයක් ඉක්මවූ පසු හෝ අදාළ වගාවෙහි කිරි කැපීම ආරම්භ කළ පසු ඉහත සඳහන් ආධාර වාරික කිසිවක් ගෙවීම කරනු නොලැබිය යුතුය. 8 වැනි නියෝගයේ 'අ' ඡේදයට අදාළව එය වසර හතක් වේ. මෙම නියෝගය 2011 වර්ෂයේ හෝ ඉන් පසුව නිකුත් කරනු ලබන අවසරපත්‍ර සඳහා පමණක් වලංගු විය යුතු ය.

(4) ක්ෂේත්‍රයේ පැල සිටවූ දිනය නැවත වගා කළ දිනය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(5) නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයට හෙක්ටයාරයකට වඩා අඩු වන බිම් කොටසක් ඇතුලත්වන අවස්ථාවකදී, ගෙවිය යුතු ආධාර මුදල ගණනය කිරීමේදී එම බිම් ප්‍රමාණයට හෝ කොටසකට හෝ අදාළ වන්නා වූ මෙම නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි සඳහන්වන අනුප්‍රමාණ එම බිම් ප්‍රමාණයෙහි කොටස හෝ එක් හෙක්ටයාරයකට දරන්නා වූ අනුපාතය අනුව ගෙවීම සඳහා අදාළ විය යුතු ය.

(6) වගා කරන ලද ගස් සංඛ්‍යාව අතුරින් එසේ වගා කිරීමෙන් පසු පස්වන අවුරුද්ද අවසානයේ දී තිබිය යුතු අවම ගස් ප්‍රමාණයෙන් ගස් 2/3 ක පොළවේ සිට මැනීමේ දී සෙන්ටිමීටර් 121.92 ක් ඉහළින් කඳෙහි පරිධිය සෙන්ටමීටර් 50.80 ක වට ප්‍රමාණයක් දරන බවට තත් කාර්යය සඳහා රබර් පාලකවරයා විසින් ලියවිල්ලකින් බලය දෙනලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් මත එක් හෙක්ටාරයකට රුපියල් හත් දහසක (රු. 7,000 ක) දිරි ගැන්වීමේ දීමනාවක්, ගෙවනු ලැබිය හැකිය.

(7) (මෙහි මින්මතු 'අවසරපත්‍රධාරයා' යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ඉඩමක රබර් අළුතින් වගා කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් අයිතිකරුවකු විසින් සහනාධාර වාරික ගෙවීමේ සහ සහනාධාර වාරික ආපසු ගැනීමේ කාර්යය සඳහා රාජ්‍ය හෝ පෞද්ගලික බැංකු ශාඛාවක ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යා යුතුය.

05. (1) 10 වැනි නියෝගය යටතේ රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලබන විධාන, නියම, සීමා කිරීම් සහ තහනම් කිරීම් වලට අනුකූලව ක්‍රියා කිරීම සහ වගා කළ බිම් ප්‍රමාණය හොඳ කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වාගෙන යාම 4 වැනි නියෝගය යටතේ සහනාධාරයේ පළමුවන වාරිකය ලැබූ සෑම අවසරපත්‍රධරයකුගේ ම කාර්යය විය යුතු ය.

(2) නැවත වගා කිරීමට අවසර පත්‍රයක් නිකුත් කරන ලද බිම් ප්‍රමාණයක් වෙනුවෙන් 4 වැනි නියෝගය යටතේ සහනාධාරය එක් වාරිකයක් හෝ ඊට වැඩි ගණනාවක් තවදුරටත් ගෙවනු ලැබීමට ඉතිරිව ඇති යම් අවසරපත්‍රධරයකු විසින් රබර් පාලකවරයාගේ ලිඛිත අනුමැතය නොමැතිව එම මුලු බිම් ප්‍රමාණය හෝ ඉන් කොටසක් හෝ විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම හෝ නොකළ යුතු ය.

06. (1) යම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් 4 වැනි නියෝගය යටතේ සහනාධාරයේ පලමු වැනි වාරිකය ලැබූ යම් අවසරපත්‍රධරයකු වේද, එම අවසරපත්‍රධරයා විසින් වර්ෂයක් ඇතුළත හෝ රබර් පාලකවරයා විසින් දෙනු ලැබිය හැකි තවදුරටත් වූ කාලයක් ඇතුළත හෝ වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි ඇති වෘක්ෂලතාදිය මුලින් උදුරා දැමීම සිදුකර ;

(අ) රබර් පාලකවරයා විසින් අනුමත කරන ලද යම් වර්ගයකට හෝ වර්ගවලට අයත් රබර් පැලවලින් එම බිම් ප්‍රමාණය වගා කිරීම සම්පූර්ණ කළ යුතු ය;

(ආ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් එසේ කිරීමට නියම කරනු ලැබ ඇත්නම් රබර් පැල හා භූමි ආවරණ රනිල පැලෑටි හැර සෙසු සියලු පැලෑටි ඒ බිම් ප්‍රමාණයෙන් ඉවත් කළ යුතු ය;

(ඇ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් කරනු ලැබිය හැකි පරිදි කාණු හෝ ගල්වැටි හෝ ඒ බිම් ප්‍රමාණයේ තැනිය යුතු ය;

(ඈ) ඒ බිම් ප්‍රමාණයේ භූමි ආවරණ රනිල පැලෑටි සිටුවීම හෝ රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි පරිදි පාංශු ඛාදනය වැලැක්වීම සඳහා වෙනත් යම් පියවර ගැනීම කළ යුතු ය;

(ඉ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කරනු ලැබ ඇත්නම් එම බිම් ප්‍රමාණය වටා වැටක් ඉදිකළ යුතු ය.

(2) 6 වන නියෝගය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් වැඩ කොටසක් අයිතිකරු විසින් කරනු නොලැබූ අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින් එම වැඩ කොටස නිම කිරීම සඳහා අවශ්‍ය යයි ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි මිනිසුන් සේවයේ නියුක්ත කරවීම සහ අවශ්‍ය උපකරණ යෙදවීම කළ හැකිය.

රබර් පාලකවරයා විසින් ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම් ඒ අයිතිකරුට ගෙවිය යුතු සහනාධාරවලින් අඩු කරනු ලැබිය යුතු ය.

07. යම් ඉඩම් ප්‍රමාණයක් වෙනුවෙන් සහනාධාර හෝ ඉන් කොටසක් ගෙවනු ලැබූයේ යම් අවසරපත්‍රධරයකුට ද, ඒ සෑම අවසරපත්‍රධරයකු විසින් ම එම භූමියේ සෑම හෙක්ටයාරයක් තුළම නැවත වගාකළ යුතු අවම රබර් පැල සංඛ්‍යාව, සම්බන්ධයෙන් වූ පහත දැක්වෙන නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට වගබලා ගත යුතු අතර, ඉඩම් හෙක්ටයාර් එකකට වගා කළ යුතු අවම රබර් පැල සංඛ්‍යාව;

(අ) (i) නැවත වගා කිරීමේ කවර හෝ අවස්ථාවක දී, රබර් පාලක විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ *(RRIC, RRISL)* රබර් ක්ලෝන, වෙනත් වැඩි ඵලදාවක් ලබා දෙන බද්ධ රබර් පැල වර්ග නැවත වගාකරන අවස්ථාවේ දී හෙක්ටයාරයකට 516 වන පරිදි හා ;

(ii) නැවත වගා කිරීමෙන් පසුව ප්‍රථම වර්ෂය හා දෙවන වර්ෂය අවසානයේ හෙක්ටයාරයකට 516 වන පරිදි ;

(iii) නැවත වගා කිරීමෙන් පසුව තෙවන වර්ෂය හා හතරවන වර්ෂය අවසානයේ හෙක්ටයාරයකට 475 ක් වන පරිදි;

(iv) නැවත වගා කිරීමෙන් පසු ඊලඟට එළඹෙන අනුක්‍රමික වර්ෂ දෙක අවසානයේ හෙක්ටයාරයකට 450ක් ලෙස;

(v) මෙම නියෝගවල 8 වැනි නියෝගයේ (ආ) ඡේදය සම්බන්ධයෙන් වන විට, වගා කිරීමෙන් පසුව එළඹෙන ඊලඟ අනුක්‍රමික වසර තුන සඳහා පැළ 450ක් විය යුතු ය.

(ආ) බද්ධ කරන ලද රබර් වගා කිරීම පහත දක්වා ඇති දුර ප්‍රමාණයන්ගෙන් හා දක්වා ඇති පැළ සංඛ්‍යාවලින් යුතු විය යුතු ය :–

(i) *RRIC,* වර්ගයේ සහ වෙනත් වැඩි ඵලදාව සහිත රබර් ක්ලෝන වගා කිරීම සඳහා :

| *පරතරය* | *පැළ* | |
|---|---|---|
| සෙ.මී 350 x සෙ. මී 550 | හෙක්ටයාරයකට | 516 |
| (11' 6" x 18') | (අක්කරයකට | 209) |
| සෙ.මී 430 x සෙ. මී 450 | හෙක්ටයාරයකට | 516 |
| (14' x 14' 9") | (අක්කරයකට | 209) |

(ආ) *RRIC, RRISL* වර්ගයේ සහ වෙනත් වැඩි ඵලදාවක් ඇති බද්ධ රබර් පැල සමග අතුරු බෝග වගා කිරීම සඳහා ;

| | | |
|---|---|---|
| සෙ.මී 250 x සෙ. මී 775 | හෙක්ටයාරයකට | 516 |
| (8' x 26") | (අක්කරයකට | 209) |

(ඇ) ඉහත නියම කළ දුර ප්‍රමාණයන් නොසලකා ඉඩමේ පිහිටීම අනුව පැළ සිටුවීම සඳහා වෙනත් දුර ප්‍රමාණයන් රබර් පාලකවරයා විසින් අනුමත කළ හැකිය. එසේ වුව ද පැළ අතර අවම දුර ප්‍රමාණ මේ නියෝගයේ (ආ) ඡේදයේ (*i*) හා (*ii*) වන අනු ඡේදවල නියමිත දුර ප්‍රමාණවල සංඛ්‍යාවට අනුකූල විය යුතු ය.

08. යම් බිම් ප්‍රමාණයක වගා කරන ලද රබර් පැල පොළවේ සිට සෙන්ටිමීටර් 121.92 ක උසින් හා අවම වට ප්‍රමාණය පහත සඳහන් පරිදි පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම එම ඉඩම් කොටස වෙනුවෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති සෑම අවසරපත්‍රධරයකුගේ ම කාර්යය විය යුතු ය;

(අ) එම බිම් ප්‍රදේශය සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සෙන්ටිමීටර් 254 ක් සහ ඊට වැඩියෙන් ඇති දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක මෙහි පහත දැක්වෙන I වැනි තීරයේ සඳහන් පරිදි විය යුතු ය, සහ

| *I වැනි තීරය* | *සෙන්ටිමීටර්* |
|---|---|
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 15.87 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 25.40 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 31.75 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හයවන වර්ෂය අවසානයට වඩා පසු නොවන කාලයක දී | 50.80 |

(ආ) එම බිම් ප්‍රදේශය සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සෙන්ටිමීටර් 254 ක් සහ ඊට අඩුවෙන් ඇති දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක පහත දැක්වෙන II වැනි තීරයේ සඳහන් පරිදි විය යුතු ය.

| *I වැනි තීරය* | *සෙන්ටිමීටර්* |
|---|---|
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 13.97 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 22.86 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 27.94 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හත්වන වර්ෂය අවසානයට වඩා පසු නොවන කාලයක දී | 50.80 |

09. යම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ලැබූ කිසිදු අවසරපත්‍රධරයකු විසින් යම් බිම් ප්‍රමාණයක නැවත වගා කරන ලද රබර් පැලවලින් යටත් පිරිසෙයින් සියයට හැටක්වත් පොළෙවේ සිට මැනීමේ දී, සෙන්ටිමීටර් එකසිය විසි එකයි දශම නවයයි දෙකක (121.92) උසින් අවම වශයෙන් සෙන්ටිමීටර් පනහයි දශම අටයි බින්දුවක (50.80) වට ප්‍රමාණය දක්වා වැඩෙන තෙක් රබර් ගස්වල කිරි කැපීම හෝ කිරි කැපීමට සැලැස්වීම නොකළ යුතු ය.

10. යම් අවසරපත්‍රධරයකු වෙත 4 වැනි නියෝගය යටතේ සහනාධාරයක් ගෙවිය හැකි හෝ කොටස් වශයෙන් ගෙවා ඇති අවස්ථාවක රබර් පාලකවරයා විසින් ඒ සඳහා ලිඛිත දැන්වීමකින් නියම කරනු ලබන කාලය ඇතුළත රබර් වත්තක හෝ සතුටුදායක අන්දමින් වගා කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි රබර් පාලකවරයා විසින් සළකනු ලබන්නාවූ ද, ඔහු විසින් ලිඛිතව නිකුත් කරනු ලබන්නා වූ ද විධාන, නියම, හෝ තහනම් කිරීම හෝ අනුව ඒ අවසරපත්‍රධරයා කටයුතු කළ යුතු ය.

11. රබර් පාලකවරයාගේ මතය අනුව ඃ

(අ) සහනාධාරයක් හෝ ඉන් කොටසක් ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍රධරයකු විසින් 5 වැනි, 6 වැනි, 7 වැනි, 8 වැනි හෝ 9 වැනි නියෝගවල කවර හෝ විධානයන් කඩකර ඇති අවස්ථාවක ; හෝ

(ආ) සහනාධාරය හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති අවසරපත්‍රධරයෙකුගේ නොසැලකිල්ල නිසා හෝ නිසි උද්යෝගයක් නොමැතිකම නිසා හෝ 8 වන නියෝගයෙහි නිශ්චිතව සඳහන් කර ඇති නියමවලට අනුකූල නොවන පරිදි බිම් ප්‍රදේශයක රබර් පැල නැවත වගා කර ඇති අවස්ථාවක ; හෝ

(ඇ) සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍රධරයකු තමා වෙත 10 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් විධානයකට, නියමයකට, සීමා කිරීමකට හෝ තහනම් කිරීමකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක,

රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ අවසරපත්‍රධරයාට යම් භූමියක් සම්බන්ධයෙන් ගෙවනු ලැබ ඇති සහනාධාර මුදල නොපමාව නැතහොත් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් තුළ ආපසු ගෙවන ලෙස නියම කළ යුතු අතර, මේ නියෝගය යටතේ දැන්වීම භාරදෙනු ලැබූ කිසිදු අවසරපත්‍රධරයකු විසින් ඒ දැන්වීමට අනුකූලව කටයුතු කිරීම පැහැර නොහැරිය යුතු ය.

12. මේ නියෝගය යටතේ වූ බලතල පැවරීමේ බලය හැර රබර් පාලකවරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් මේ නියෝගය යටතේ තමා සතුවී ඇති හෝ තමාට නියමකර ඇති හෝ පවරා දී ඇති බලතල, කාර්යය හෝ කර්තව්‍යය අතරින් යම් බලයක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙකු වෙත පවරනු ලැබිය හැකිය.

13. (අ) මේ නියෝගවල 5 වැනි, 6 වැනි, 7 වැනි, 8 වැනි, 9 වැනි, 10 වැනි හෝ 11 වැනි නියෝගවල විධිවිධාන කඩකරන්නා වූ ; හෝ

(ආ) මේ නියෝග යටතේ වූ යම් ඉල්ලුම්පත්‍රයක හෝ ප්‍රකාශනයක හෝ යම් ප්‍රකාශයක අසත්‍ය බව තමන් දන්නා යම් වැදගත් කරුණක් ප්‍රකාශ කරන්නා වූ ; හෝ

(ඇ) සහනාධාරයක් ලබා ගැනීම ඉල්ලන ඉල්ලුම්කරුවෙකු හෝ සහනාධාර ලබා ගත්තෙකු හෝ වශයෙන් රබර් පාලකවරයා වෙත යම් අසත්‍ය තොරතුරක් සපයන්නා වූ ;

සෑම තැනැත්තෙකු ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

14. (1) මේ නියෝග යටතේ රබර් පාලකවරයා විසින් සහනාධාර ලෙස යම් අවසරපත්‍රධරයකුට ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණ නැවත ආපසු ගෙවීමක් කර නොමැති විටක දී අධිකරණයක් මගින් පනවනු ලැබූ දඩයක් ලෙස එම මුදල් ප්‍රමාණය නැවත අයකර ගත හැකිය.

(2) සහනාධාර වාරික එකක් හෝ වැඩි ගණනක් ලබා ගැනීමෙන් අනතුරුව එම සහනාධාර ආපසු ගෙවීම පැහැර හරිමින් යම් තැනැත්තකු විසින් කුඩා ඉඩමක් හෝ වත්තක් අත්හැර දැමූ බවට රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඒ කරුණ පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

15. කලින් කල සංශෝධිත පරිදි, 1953 ඔක්තෝබර් මස 3 වැනි දින අංක 10594 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද 1953 රබර් නැවත වගා කිරීමේ සහනාධාර නියෝගවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පිළිවෙලින් 2005, 2006, 2007, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද රබර් නැවත වගා කිරීමේ යම් අවසරපත්‍රයක් මත ගෙවිය යුතු පහත සඳහන් සහනාධාර වාරික 4 වැනි නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති අනුප්‍රමාණ මත පහත දැක්වෙන ආකාරයට ගෙවනු ලැබිය යුතු ය. එසේ වුවද මෙම වාරික ගෙවිය යුත්තේ මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී එම අවසර පත්‍රය මත ගෙවිය යුතු වාරික සියල්ලම ගෙවා නොමැති නම් පමණි.

පුද්ගලික අයිතිය යටතේ ඇති වතු සහ කුඩා ඉඩම් :-

2005 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඌ) නියෝගයට අනුකූලව අටවන වාරිකය ;
2006 වර්ෂය - මෙම නියෝගවල 4(1)(උ) නියෝගයට අනුකූලව හත්වන වාරිකයේ සිට ඉදිරියට ;
2007 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඊ) නියෝගයට අනුකූලව හයවන වාරිකයේ සිට ඉදිරියට ;
2008 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඉ) නියෝගයට අනුකූලව පස්වන වාරිකයේ සිට ඉදිරියට ;
2009 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඈ) නියෝගයට අනුකූලව හතරවන වාරිකයේ සිට ඉදිරියට ;
2010 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඇ) නියෝගයට අනුකූලව තුන්වන වාරිකයේ සිට ඉදිරියට ;
2011 වර්ෂය - මෙම නියෝගවල 4(1)(අ) සහ/හෝ (ආ) නියෝගයවලට අනුකූලව පළමුවන වාරිකයේ සිට ඉදිරියට.

16. මෙම නියෝගවල -

"අයිතිකරු" යන්නට (436 වැනි අධිකාරිය වූ) රබර් පාලන පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

"වත්ත" යන්නෙන්, රබර් ගස්වලින් කිරි එකතු කර ගැනීම සඳහා රබර් පැල වවනු ලබන විශාලත්වයෙන් හෙක්ටයාර් 4.04ට නොඅඩු ඉඩම් කොටසක් අදහස් වේ.

"නැවත වගා කිරීමේ අවසර පත්‍ර" යන්නෙන් (436 වැනි අධිකාරිය වූ) රබර් පාලන පනතේ 7(1) වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වේ.

"කුඩා ඉඩම" යන්නෙන් රබර් ගස් වලින් කිරි එකතු කර ගැනීම සඳහා රබර් පැල වවනු ලබන විශාලත්වයෙන් හෙක්ටයාර් 4.04කට අඩු ඉඩමේ කොටසක් අදහස් වේ. තව ද,

"රබර් පාලකවරයා" යන්නෙන් රබර් පාලන පනත යටතේ පත්කරන ලද හෝ පත්කරනු ලැබ ඇතැයි සලකනු ලබන රබර් පාලකවරයෙකු අදහස් වන අතර, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළත් වන්නේ ය.

10-299/3

---

එල්.ඩී.බී. 51/53 (iii).

**(437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත**

(437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද සමරසිංහ,
වැවිලි කර්මාන්ත අමාත්‍ය.

2012 ක් වූ අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මේ නියෝග 2012 අංක 917/4 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර (රබර් සමග තේ වැවීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. යම් වත්තක හෝ කුඩා ඉඩමක අයිතිකරුවෙකු වන යම් තැනැත්තෙකු විසින් කරනු ලබන තත් කාර්යය සඳහා වූ ලිඛිත ඉල්ලීමක් මත, රබර් පාලකවරයා විසින් ඒ වත්තේ හෝ කුඩා ඉඩමේ රබර් සමග තේ වගා කිරීමේ කාර්යය සඳහා (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) (437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලින් ඒ තැනැත්තාට සහනාධාරයක් මෙම නියෝගවල විධිවිධානවලට අනුකූලව ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

03. 2 වැනි නියෝග යටතේ සහනාධාරයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, රබර් පාලකවරයා විසින් තත් කාර්යය සඳහා කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි යම් ආකෘති පත්‍රයකට සාරානුකූලව ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

04. (1) 2011 වර්ෂය හෝ ඉන් පසුව එළඹෙන වර්ෂයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද රබර් නැවත වගා කිරීමේ බලපත්‍රයක් මත අනන්‍ය පෞද්ගලික හිමිකාරත්වයක් තිබෙන වත්තක හෝ කුඩා ඉඩමක නිශ්චිතව සඳහන් කරන ලද කිසියම් කොටසක රබර් සමග තේ නැවත වගා කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාර ප්‍රමාණය නැවත වගා කරනු ලැබිය යුතු එක් හෙක්ටයාරයක ප්‍රමාණයක් සඳහා රුපියල් එක් ලක්ෂ විසි දෙදහස් පන්සියයක් (රු.1,22,500) විය යුතු අතර එය පහත දැක්වෙන ආකාරයේ වාරික අටකින් ගෙවනු ලැබිය යුතු ය :–

(අ) (i) නැවත වගා කිරීමට අවසර දී ඇති බිම් ප්‍රමාණයේ ඇති අනෙකුත් වෘක්ෂලතාදිය මුලින් උදුරා දැමීමෙන් සහ රබර් නැවත වගා කිරීම සඳහා වලවල් හෑරීමෙන් පසුව එසේ නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයේ එක් එක් හෙක්ටයාරයකට රුපියල් පන්දහස් හයසියයක් (රු.5,600) බැගින් වූ පළමු වාරිකය ගෙවනු ලැබිය යුතුය මෙම වාරිකය වලවල් හෑරීමට ප්‍රථම නොගෙවිය යුතු ය. නැතහොත් ;

(i) වගා කිරීමට පෙර අවසර දී ඇති බිම් ප්‍රමාණයේ ඇති රබර් ගස් සහ අනෙකුත් වෘක්ෂලතා ආදිය මුලින් උදුරා දැමීමෙන් පසුව එක් හෙක්ටයාරයකට රුපියල් පන්දහස් හයසියයක් (රු.5600) බැගින් වූ පළමු වාරිකය ගෙවිය යුතු ය. තිබෙන්නා වූ රබර් ගස් උදුරා දැමීම සම්පූර්ණ කළ බව වත්තේ හෝ කුඩා ඉඩමේ අයිතිකරු විසින් රබර් පාලකවරයාට දැනුම් දුන්විට එම මුදලෙන් 50%කට නොවැඩි මුදලක් කොටස් ගෙවීමක් වශයෙන් ගෙවිය හැකි ය.

(ආ) නැවත වගා කිරීම සම්පූර්ණ කළවිට, එක් එක් හෙක්ටයාරයකට රුපියල් තිස්දහස් එකසියය (රු. 30,100) බැගින් වූ දෙවැනි වාරිකය ගෙවිය යුතු ය, වගා කිරීම සම්පූර්ණ කළබව දැනුම් දුන් විට රබර් පාලකවරයා විසින් මෙම මුදලෙන් 50% ට නොවැඩි මුදලක් වත්තේ හෝ කුඩා ඉඩමේ අයිතිකරුට කොටස් ගෙවීමක් වශයෙන් ගෙවිය හැකිය. නැවත වගා කිරීමෙන් පසු පවත්වනු ලබන පරීක්ෂණයක දී වාරික මුදල් ලැබීමට සුදුසු පරිදි සියලුම අවශ්‍ය වැඩ කොටස් සම්පූර්ණ කොට නොමැති බව පෙනී ගියහොත් සතුටුදායක අන්දමින් සම්පූර්ණ කර ඇති අයිතමයන් වෙනුවෙන් පහත සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබිය හැකිය :

| | හෙක්ටයාරයකට රු. ශත |
|---|---|
| 1. වලවල් හෑරීම හා බද්ධ පැල සිටුවීම | 15,400.00 |
| 2. පාංශු සංරක්ෂණ කටයුතු (අගල් කැපීම, ගල් වැටි හෝ වේදිකා ඉදිකිරීම) | 7,000.00 |
| 3. වැට බැඳීම | 2,100.00 |

ගෙවීමට ඇති ඉතිරි මුදලක් වේ නම් නිම නොකළ වැඩ කොටස් සම්පූර්ණ කළ පසුව පමණක් ගෙවනු ලැබිය යුතු ය. තව ද, උක්ත වැඩ කොටස් සම්පූර්ණ කරන තුරු සෙසු ආධාර වාරික ගෙවීම් අත්හිටුවිය යුතු ය.

(ඇ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් දස දහස් පන්සියය (රු. 10,500/) බැගින් වූ තුන්වැනි වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ගත වීමෙන් පසුව ගෙවනු ලැබිය යුතු ය;

(ඈ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් දහ හතර දහස් හත්සියය (රු. 14,700) බැගින් වූ හතර වැනි වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඉ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් දහ හතර දහස් හත්සියය (රු. 14,700) බැගින් වූ පස්වැනි වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඊ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් දහ හතර දහස් හත්සියය (රු. 14,700) බැගින් වූ හයවැනි වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හතරකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(උ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් පහළොස් දහස් හාරසියය (රු. 15,400) බැගින් වූ හත්වැනි වාරිකය නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු පහකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය;

(ඌ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් දහසය දහස් අටසියය (රු. 16,800) බැගින් වූ අටවැනි වාරිකය –

(i) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හයක කාලයක් ගතවීමට පෙර, හා

(ii) කිරි කැපීමට සුදුසු මට්ටමට වට ප්‍රමාණය වර්ධනය වී ඇති සියලුම රබර් ගස්වලට වැසි ආවරණ යොදන තෙක් ඉහත අටවැනි වාරිකය නොගෙවිය යුතු ය. කිරි කැපීමට සුදුසු මට්ටමට වට ප්‍රමාණය වර්ධනය වී ඇති ගස්වලට ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කරනු ලබන අයුරින් වැසි ආවරණ යොදනු ලැබිය යුතු අතර,

මේ නියෝගවල 08 වැනි නියෝගයේ (ආ) ජේදය සඳහා මෙය අදාළ නොවනු ඇත.

(2) එසේ වුවද මෙම නියෝගයේ (1) ජේදයේ (ඇ) සිට (ඌ) දක්වා වූ ජේදවල නිශ්චිතව සඳහන් කර ඇති අවම ප්‍රමිතීන් එහි සඳහන් නියමිත කාලයට පෙරාතුව සම්පූර්ණව ඇති බවට රබර් පාලකවරයා සෑහීමකට පත් වන්නේ නම් ඔහුගේ අභිමතය පරිදි අදාළ වාරිකය නියමිත කාලයට පෙර මුදාහළ හැකිය.

(3) රබර් පැල නැවත සිටුවා අවසන් කර අවුරුදු හයක් ඉක්මවූ පසු හෝ අදාළ වගාවෙහි කිරි කැපීම ආරම්භ කළ පසු ඉහත සඳහන් ආධාර වාරික කිසිවක් ගෙවීම කරනු නොලැබිය යුතු ය. 8 වැනි නියෝගයේ 'ආ' ජේදයට අදාළව එය වසර හතක් වේ. මෙම නියෝගය 2011 වර්ෂයේ හෝ ඉන් පසුව නිකුත් කරනු ලබන අවසරපත්‍ර සඳහා පමණක් වලංගු විය යුතු ය.

(4) ක්ෂේත්‍රයේ පැල සිටවූ දිනය නැවත වගා කළ දිනය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(5) නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාරයකට වඩා අඩු වන අවස්ථාවක දී හෝ ඒ බිම් ප්‍රමාණයට හෙක්ටයාරයකට වඩා අඩුවන බිම් කොටසක් ඇතුළත් වන අවස්ථාවක දී, හෝ ගෙවිය යුතු ආධාර මුදල ගණනය කිරීමේ දී, එම බිම් ප්‍රමාණයට හෝ කොටසට හෝ අදාළ වන්නා වූ මෙම නියෝගයෙහි (1) වැනි ජේදයෙහි සඳහන් වන අනුප්‍රමාණ එම බිම් ප්‍රමාණය හෝ බිම් ප්‍රමාණයෙහි කොටස හෝ එක් හෙක්ටයාරයකට දරන්නා වූ අනුපාතය අනුව ගෙවීම සඳහා අදාළ විය යුතු ය.

(6) වගා කරන ලද ගස් සංඛ්‍යාව අතුරින් එසේ වගා කිරීමෙන් පසු පස්වැනි අවුරුද්ද අවසානයේ දී තිබිය යුතු අවම ගස් ප්‍රමාණයෙන් ගස් 2/3 ක පොළවේ සිට මැනීමේ දී සෙන්ටිමීටර් 121.92 ක් ඉහළින් කඳෙහි පරිධිය සෙන්ටිමීටර් 50.80 ක වට ප්‍රමාණයක් දරන බවට තත් කාර්යය සඳහා රබර් පාලකවරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් මත එක් හෙක්ටයාරයකට රුපියල් හාර දහස් නවසියයක (රු. 4,900/ක) දිරි ගැන්වීමේ දීමනාවක්, ගෙවනු ලැබිය හැකිය.

(7) (මෙහි මින්මතු 'අවසරපත්‍රධරයා' යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ඉඩමක රබර් නැවත වගා කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් අයිතිකරුවෙකු විසින් සහනාධාර වාරික ගෙවීමේ සහ සහනාධාර වාරික ආපසු අයකර ගැනීමේ කාර්යය සඳහා රාජ්‍ය හෝ පෞද්ගලික වාණිජ බැංකු ශාඛාවක ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යා යුතු ය.

(8) රබර් හා තේ වගා කිරීම වෙනුවෙන් ගෙවනු ලබන සහනාධාර වාරික ගෙවනු ලබන්නේ වැවිලි දෙකම සතුටුදායක ලෙස පවත්වාගෙන යන්නේ නම් පමණි.

05. (1) 10 වැනි නියෝගය යටතේ රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලබන විධාන, නියම, සීමා කිරීම් සහ තහනම් කිරීම් වලට අනුකූලව ක්‍රියා කිරීම සහ අළුතින් වගා කල බිම් ප්‍රමාණය හොඳ කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වාගෙන යාම 4 වැනි නියෝගය යටතේ සහනාධාරයේ පළමුවැනි වාරිකය ලැබූ සෑම අවසරපත්‍රධරයෙකුගේ ම කාර්යය විය යුතු ය.

(2) නැවත වගා කිරීමට අවසර පත්‍රයක් නිකුත් කරන ලද බිම් ප්‍රමාණයක් වෙනුවෙන් 4 වැනි නියෝගය යටතේ සහනාධාරය එක් වාරිකයක් හෝ ඊට වැඩි ගණනාවක් තවදුරටත් ගෙවනු ලැබීමට ඉතිරිව ඇති යම් අවසරපත්‍රධරයකු විසින් රබර් පාලකවරයාගේ ලිඛිත අනුමතය නොමැතිව එම මුළු බිම් ප්‍රමාණය හෝ ඉන් කොටසක් හෝ විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම හෝ නොකළ යුතු ය.

06. (1) මේ ඉඩමක නැවත රබර් වගා කිරීම සඳහා 4 වැනි නියෝගය යටතේ සහනාධාරයේ පළමු වාරිකය ගෙවන ලද ඕනෑම අවසරපත්‍රධරයකු විසින් වර්ෂයක් ඇතුළත හෝ රබර් පාලකවරයා විසින් දෙනු ලැබිය හැකි තවදුරටත් වූ කාලයක් ඇතුළත, හෝ -

(අ) රබර් පාලකවරයා විසින් අනුමත කරන ලද යම් වර්ගයකට හෝ වර්ගවලට අයත් රබර් පැලවලින් එම බිම් ප්‍රමාණය වගා කිරීම සම්පූර්ණ කළ යුතු ය;

(ආ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් එසේ කිරීමට නියම කරනු ලැබ ඇත්නම් රබර් පැල හා තේ පැල හැර සෙසු සියලු පැලෑටි ඒ බිම් ප්‍රමාණයෙන් ඉවත් කළ යුතු ය;

(ඇ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් කරනු ලැබිය හැකි පරිදි කාණු හෝ ගල්වැටි හෝ ඒ බිම් ප්‍රමාණයේ තැනිය යුතු ය;

(ඈ) ඒ බිම් ප්‍රමාණයේ රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි පරිදි පාංශු ඛාදනය වැලැක්වීම සඳහා වෙනත් යම් පියවර ගැනීම කළ යුතු ය;

(ඉ) රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කරනු ලැබ ඇත්නම් එම බිම් ප්‍රමාණය වටා වැටක් ඉදි කළ යුතු ය.

(2) (අ) 6 වැනි නියෝගය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් වැඩ කොටසක් අයිතිකරු විසින් කරනු නොලැබූ අවස්ථාවක දී, රබර් පාලකවරයා විසින් එම වැඩ කොටස නිම කිරීම සඳහා අවශ්‍ය යයි ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි මිනිසුන් සේවයේ නියුක්ත කරවීම සහ අවශ්‍ය උපකරණ යෙදවීම කළ හැකිය.

(ආ) රබර් පාලකවරයා විසින් ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම් ඒ අයිතිකරුට ගෙවිය යුතු සහනාධාරවලින් අඩු කරනු ලැබිය යුතු ය.

07. යම් ඉඩම් ප්‍රමාණයක් වෙනුවෙන් සහනාධාර හෝ ඉන් කොටසක් ගෙවනු ලැබූයේ යම් අවසරපත්‍රධරයකුට ද, ඒ සෑම අවසරපත්‍රධරයකු විසින් ම එම ප්‍රදේශයේ සෑම හෙක්ටයාරයක් තුළම නැවත වගාකළ යුතු අවම රබර් පැල සංඛ්‍යාව, සම්බන්ධයෙන් වූ පහත දැක්වෙන නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට වගබලා ගත යුතු අතර, ඉඩම් හෙක්ටයාර් එකකට වගා කළ යුතු අවම රබර් පැල සංඛ්‍යාව -

(අ) (i) නැවත වගා කිරීමේ කවර හෝ අවස්ථාවක දී, රබර් පාලක විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ *(RRIC* හා *RRISL)* රබර් ක්ලෝන, වෙනත් වැඩි ඵලදාවක් ලබා දෙන බද්ධ රබර් පැල වර්ග වගාකර තිබේ නම් හෙක්ටයාරයකට 360 වන පරිදි ; හෝ

(ii) නැවත වගා කිරීමෙන් පසුව ප්‍රථම වර්ෂය හා දෙවැනි වර්ෂය අවසානයේ හෙක්ටයාරයකට 360 වන පරිදි ;

(iii) නැවත වගා කිරීමෙන් පසුව තෙවැනි වර්ෂය හා හතරවැනි වර්ෂය අවසානයේ හෙක්ටයාරයකට 320 ක් වන පරිදි;

(iv) නැවත වගා කිරීමෙන් පසු ඊළඟට එළඹෙන අනුක්‍රමික වර්ෂ දෙක අවසානයේ හෙක්ටයාරයකට 300 ක් ලෙස;

(v) මෙම නියෝගවල 8 වැනි නියෝගයේ (ආ) ඡේදය සම්බන්ධයෙන් වන විට, වගා කිරීමෙන් පසුව එලඹෙන ඊළඟ අනුක්‍රමික වසර තුන සඳහා පැල 300 ක් විය යුතු ය.

(ආ) බද්ධ කරන ලද රබර් පැල වගා කිරීම පහත දක්වා ඇති දුර ප්‍රමාණයන්ගෙන් හා දක්වා ඇති පැල සංඛ්‍යාවලින් යුතු විය යුතු ය :–

(i) *RRIC, RRISL* වර්ගයේ සහ වෙනත් වැඩි ඵලදාව සහිත රබර් ක්ලෝන තේ සමග වගා කිරීම සඳහා :

| *පරතරය* | *පැළ* | |
|---|---|---|
| (අ) සෙ.මී 244 x සෙ. මී 1220 | හෙක්ටයාරයකට | 360 |
| (8' x 40') | (අක්කරයකට | 145) |
| (ආ) දුර ප්‍රමාණය සෙ.මී 274.5 x සෙ. මී 274.5 රබර් ද්විත්ව පේළි x සෙ.මී. 1830 | හෙක්ටයාරයකට | 325 |
| (9' x 9' x 60') | (අක්කරයකට | 130) |

(ඇ) ඉහත නියම කළ දුර ප්‍රමාණයන් නොසලකා ඉඩමේ පිහිටීම අනුව පැළ සිටුවීම සඳහා වෙනත් දුර ප්‍රමාණයන් රබර් පාලකවරයා විසින් අනුමත කළ හැකිය. එසේ වුවද පැළ අතර අවම දුර ප්‍රමාණ මේ නියෝගයේ (ආ) ඡේදයේ (*i*) හා (*ii*) වන අනු ඡේදවල නියමිත දුර ප්‍රමාණවල සංඛ්‍යාවට අනුකූල විය යුතුය.

08. යම් බිම් ප්‍රමාණයක වගා කරන ලද රබර් පැල පොළවේ සිට සෙන්ටිමීටර් 121.92 ක උසින් හා අවම වට ප්‍රමාණය පහත සඳහන් පරිදි පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම එම ඉඩම් කොටස වෙනුවෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති සෑම අවසරපත්‍රධරයකුගේ ම කාර්යය විය යුතු ය.

(අ) එම බිම් ප්‍රදේශය සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සෙන්ටිමීටර් 254 ක් සහ ඊට වැඩියෙන් ඇති දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක මෙහි පහත දැක්වෙන I වැනි තීරයේ සඳහන් පරිදි විය යුතු ය, සහ

(ආ) එම බිම් ප්‍රදේශය සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සෙන්ටිමීටර් 254 ක් සහ ඊට අඩුවෙන් ඇති දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක පහත දැක්වෙන II වැනි තීරයේ සඳහන් පරිදි විය යුතු ය.

| *I වැනි තීරය* | *සෙන්ටිමීටර්* |
|---|---|
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 15.87 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 25.40 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 31.75 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හයවන වර්ෂයේ අවසානයට වඩා පසු නොවන කාලයකදී | 50.80 |

| *II වැනි තීරය* | *සෙන්ටිමීටර්* |
|---|---|
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 13.97 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 22.86 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 27.94 |
| නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හත්වන වර්ෂයේ අවසානයට වඩා පසු නොවන කාලයකදී | 50.80 |

09. යම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් සහනාධාරයන් හෝ ඉන් යම් කොටසක් හෝ ලැබූ කිසිදු අවසරපත්‍රධරයකු විසින් යම් බිම් ප්‍රමාණයක නැවත වගා කරන ලද රබර් පැලවලින් යටත් පිරිසෙයින් සියයට හැටක්වත් පොළවේ සිට මැනීමේ දී, සෙන්ටිමීටර් එකසිය විසි එකයි දශම නවයයි දෙකක (121.92) උසින් අවම වශයෙන් සෙන්ටිමීටර් පනහයි දශම අටයි බින්දුවක (50.80) වට ප්‍රමාණය දක්වා වැඩෙන තෙක් රබර් ගස්වල කිරි කැපීම හෝ කිරි කැපීමට සැලැස්වීම නොකළ යුතු ය.

10. යම් අවසරපත්‍රධරයකු වෙත 4 වැනි නියෝගය යටතේ සහනාධාරයක් ගෙවිය හැකි හෝ කොටස් වශයෙන් ගෙවා ඇති අවස්ථාවක රබර් පාලකවරයා විසින් ඒ සඳහා ලිඛිත දැන්වීමකින් නියම කරනු ලබන කාලය ඇතුළත රබර් වත්තක හෝ කුඩා ඉඩමක හෝ සතුටුදායක අන්දමින් වගා කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි රබර් පාලකවරයා විසින් සළකනු ලබන්නාවූ ද, ඔහු විසින් ලිඛිතව නිකුත් කරනු ලබන්නා වූ ද විධාන, නියම හෝ තහනම් කිරීම හෝ අනුව ඒ අවසරපත්‍රධරයා කටයුතු කළ යුතු ය.

11. රබර් පාලකවරයාගේ මතය අනුව :

(අ) සහනාධාරයක් හෝ ඉන් කොටසක් ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍රධරයකු විසින් 5 වැනි, 6 වැනි, 7 වැනි, 8 වැනි හෝ 9 වැනි නියෝගවල කවර හෝ විධානයන් කඩකර ඇති අවස්ථාවක ; හෝ

(ආ) සහනාධාරය හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති අවසරපත්‍රධරයෙකුගේ නොසැලකිල්ල නිසා හෝ නිසි උද්යෝගයක් ප්‍රයත්නයක් නොමැතිකම නිසා හෝ 8 වැනි නියෝගයෙහි නිශ්චිතව සඳහන් කර ඇති නියමවලට අනුකූල නොවන පරිදි බිම් ප්‍රදේශයක රබර් පැල නැවත වගා කර ඇති අවස්ථාවක ; හෝ

(ඇ) සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍රධරයකු තමා වෙත 10 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් විධානයක, නියමයක, සීමා කිරීමකට හෝ තහනම් කිරීමකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක,

රබර් පාලකවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ අවසරපත්‍රධරයාට යම් භූමියක් සම්බන්ධයෙන් ගෙවනු ලැබ ඇති සහනාධාර මුදල නොපමාව නැතහොත් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් තුළ ආපසු ගෙවන ලෙස නියම කළ යුතු අතර, මේ නියෝගය යටතේ දැන්වීම භාරදෙනු ලැබූ කිසිදු අවසරපත්‍රධරයකු විසින් ඒ දැන්වීමට අනුකූලව කටයුතු කිරීම පැහැර නොහැරිය යුතු ය.

12. මේ නියෝගය යටතේ වූ බලතල පැවරීමේ බලය හැර රබර් පාලකවරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් මේ නියෝගය යටතේ තමා සතුවී ඇති හෝ තමාට නියමකර ඇති හෝ පවරා දී ඇති බලතල, කාර්යය හෝ කර්තව්‍යය අතරින් යම් බලයක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙකු වෙත පවරනු ලැබිය හැකිය.

13. (අ) මේ නියෝගවල 5 වැනි, 6 වැනි, 7 වැනි, 8 වැනි, 9 වැනි, 10 වැනි හෝ 11 වැනි නියෝගවල විධිවිධාන කඩකරන්නා වූ ; හෝ

(ආ) මේ නියෝග යටතේ වූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ ප්‍රකාශනයක අසත්‍ය බව තමන් දන්නා යම් වැදගත් කරුණක් ප්‍රකාශ කරන්නා වූ ; හෝ

(ඇ) සහනාධාරයක් ලබා ගැනීම ඉල්ලන ඉල්ලුම්කරුවෙකු හෝ සහනාධාර ලබා ගත්තකු හෝ වශයෙන් රබර් පාලකවරයා වෙත යම් අසත්‍ය තොරතුරක් සපයන්නා වූ ;

සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

14. (1) මේ නියෝග යටතේ රබර් පාලකවරයා විසින් සහනාධාර ලෙස යම් අවසරපත්‍රධරයකුට ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණ නැවත ආපසු ගෙවීමක් කර නොමැති විටකදී අධිකරණයක් මගින් පනවනු ලැබූ දඩයක් ලෙස එම මුදල් ප්‍රමාණය නැවත අයකර ගත හැකිය.

(2) සහනාධාර වාරික එකක් හෝ වැඩි ගණනක් ලබා ගැනීමෙන් අනතුරුව එම සහනාධාර ආපසු ගෙවීම පැහැර හරිමින් යම් තැනැත්තකු විසින් කුඩා ඉඩමක් හෝ වත්තක් අත්හැර දැමූ බවට රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඒ කරුණ පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

15. කලින් කල සංශෝධිත පරිදි, 1953 ඔක්තෝබර් මස 03 වැනි දිනැති අංක 10594 දරන ගැසට් පත්‍රයේ පලකරන ලද 1953 රබර් නැවත වගා කිරීමේ සහනාධාර නියෝගවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පිළිවෙලින් 2005, 2006, 2007, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද රබර් නැවත වගා කිරීමේ යම් අවසරපත්‍රයක් මත ගෙවිය යුතු පහත සඳහන් සහනාධාර වාරික 4 වැනි නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති අනුප්‍රමාණ මත පහත දැක්වෙන ආකාරයට ගෙවනු ලැබිය යුතුය. එසේ වුව ද මෙම වාරික ගෙවිය යුත්තේ මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී එම අවසර පත්‍රය මත ගෙවිය යුතු වාරික සියල්ලම ගෙවා නොමැති නම් පමණි.

පුද්ගලික අයිතිය යටතේ ඇති වතු සහ කුඩා ඉඩම් :-

2005 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඌ) නියෝගයට අනුකූලව අටවන වාරිකය ;

2006 වර්ෂය - මෙම නියෝගවල 4(1)(උ) නියෝගයට අනුකූලව හත්වන වාරිකයේ සිට ඉදිරියට ;

2007 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඊ) නියෝගයට අනුකූලව හයවන වාරිකයේ සිට ඉදිරියට ;

2008 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඉ) නියෝගයට අනුකූලව පස්වන වාරිකයේ සිට ඉදිරියට ;

2009 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඈ) නියෝගයට අනුකූලව හතරවන වාරිකයේ සිට ඉදිරියට ;

2010 වර්ෂය - මෙම නියෝගවල 4(1)(ඇ) නියෝගයට අනුකූලව තුන්වන වාරිකයේ සිට ඉදිරියට ;

2011 වර්ෂය - මෙම නියෝගවල 4(1)(අ) සහ/හෝ (ආ) නියෝගවලට අනුකූලව පළමුවන වාරිකයේ සිට ඉදිරියට.

16. මෙම නියෝගවල -

"අයිතිකරු" යන්නට (436 වැනි අධිකාරය වූ) රබර් පාලන පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතුය;

"වත්ත" යන්නෙන්, රබර් ගස්වලින් කිරි එකතු කර ගැනීම සඳහා රබර් පැල වවනු ලබන විශාලත්වයෙන් හෙක්ටයාර් 4.04ට නොඅඩු ඉඩම් කොටසක් අදහස් වේ;

"නැවත වගා කිරීමේ අවසර පත්‍ර" යන්නෙන් (436 වැනි අධිකාරිය වූ) රබර් පාලන පනතේ 7(1) වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වේ ;

"කුඩා ඉඩම" යන්නෙන් රබර් ගස්වලින් කිරි එකතු කර ගැනීම සඳහා රබර් පැල වවනු ලබන විශාලත්වයෙන් හෙක්ටයාර් 4.04කට අඩු ඉඩමේ කොටසක් අදහස් වේ. තව ද,

"රබර් පාලකවරයා" යන්නෙන් රබර් පාලන පනත යටතේ පත්කරන ලද හෝ පත්කරනු ලැබ ඇතැයි සලකනු ලබන රබර් පාලකවරයකු අදහස් වන අතර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ඇතුළත් වන්නේ ය.

10-299/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.